

# ඍද්ධිපාද විභාවිනිය

# ශුද්ධවර්ෂාද විභාවිනිය.

මෙහි අග සඳහන්කළ ස්ථවිරාදි භික්ෂුසඞ්ඝයාගේ

අවිරුද්ධමතියෙන් ඒමතිකාගේ

ස්ථවිරකෙනෙකුන්විසින්

කාරණලදී.

ශ්‍රී බුද්ධවර්ෂ 2429

1885 ජූලිමස 1 වෙනිදින.

කොණේණ්ලිස්කුරේ අප්පුහාමිවිසින්

මුද්‍රාඞ්කණය කරවණලදී.

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 35 | ගික්ෂූන්ට | භික්ෂූන්ට |
| 4 | 21 | රදණ | දරණ |
| 5 | 31 | නූමුත් | නුමූත් |
| 6 | 32 | පරිණ්ඩල | පරිමණ්ඩල |
| 7 | 9 | ආනාදරියං | අනාදරියං |
| 9 | 6 | සාධාරයි | සාධාරණයි |
| 11 | 26 | නොකරති | නොකරයි |
| 12 | 15 | භාවය | භාවය |
| 14 | 15 | ශරිරභ්‍යන්තරා | ශරීරාභ්‍යන්තර |
| ,, | 26 | උරහීස් | උරහිස් |
| 16 | 6 | කටණ | කරණ |
| ,, | 26 | විවෘකොට | විවෘතකොට |
| ,, | 32 | ගිඳිත් | ගිඳත් |
| 17 | 25 | හූනෙත් | හූන් |
| 18 | 24 | පාසදික | පාසාදික |
| 21 | 1 | ඒකාශ | ඒකාංශ |
| ,, | 5 | පණීස | පිණීස |
| ,, | 23 | අතුළු | ඇතුළු |
| 22 | 13 | ඒකංශ | ඒකාංශ |
| 23 | 5 | බැවිත් | බැවින් |
| ,, | 28 | ඨපෙත්වා | ඨත්වා |
| ,, | ,, | උපරි | උපපරි |
| 24 | 1 | වෙයයි | වෙත්‍යයි |
| ,, | 12 | තිරුද්ධ | නිරුද්ධ |
| ,, | 14 | නියා | නිසා |
| 25 | 12 | ඇතුළුටම | ඇතුළුගමට |
| 26 | 2 | බාහන්න | බාහන්ත |
| ,, | 5 | සිරු | සවුරු |
| ,, | 8 | නිස | හිස |
| ,, | 18 | කොණ්ඩයයට | කොණ්ඩයට |
| 27 | 16 | නීයම | නියම |
| ,, | 20 | නිසීදන | නිසීදන |
| 28 | 1 | පචිසෙයය | පච්සෙය්‍ය |
| ,, | 9 | ලදු | ලද් |

| පිට. | පෙළ. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| ,, | 10 | විසන් | විසින් |
| ,, | 27 | පාරපිත්වා | පාරුපිත්වා |
| ,, | 36 | යමණ්ණං | සමණ්ණං |
| 29 | 18 | පාසදිකා | පාසාදිකා |
| ,, | 31 | තබ්බ | තබ්බො |
| 30 | 3 | පාසදිකා | පාසාදිකා |
| ,, | 15 | යාඤ්ඤතුඤ්ඤසි | යාඤ්ඤතුසි |
| ,, | 26 | කණ්ණ | කණ්ණො |
| ,, | 32 | තත් | නත් |
| ,, | 34 | නමුන් | නමුත් |
| 31 | 13 | ලඝුකාස් | ලඝුකා |
| 32 | 8 | ඇතුළුකො | ඇතුළුකොට |
| ,, | 11 | සිරු | සිවුරු |
| 34 | 15 | බහර | බැහැර |
| 35 | 23 | නො(අඩු) | [illegible] |

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

වන්දිත්වා වදතං සෙට්ඨං
බුද්ධමප්පටිපුග්ගලං
ධම්මඤ්චත්ථස්ස දාතාරං
සඞ්ඝං ධම්මානුවත්තිනං,

භික්ඛූනං සුණාතං සුට්ඨු
නිවාසාදිවිභාගතො
පවක්ඛාම සුඛග්ගාහං
සුඛවණ්ණාදිවිභාවිනිං.

සමන්තභද්‍රවූ සර්වඥයන්වහන්සේවිසින් සකලසත්වයන් කෙ
රෙහි පතළ මහාකරුණාවෙන් ධර්මවිනය දෙශනාකොට වදා
රා ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගයෙහි පිළිපැදීම පණවා වදාරණලද්දේ
ය ඒ සර්වඥයන්වහන්සේ විසින් වදාරණලද පර්‍ය්‍යාප්තිය තත්වූ
පරිද්දෙන් පිළිපදනෝ ප්‍රතිවෙධ ධර්මය ප්‍රත්‍යක්ෂකොට ගෙ
ණ සියළු දුක් කෙළවරකොට දුඃඛාතික්‍රමයෙන් අමෘතමහා
නිර්වාණයට පැමිණෙති—ඒ භාග්‍යවත්සර්වඥයන්වහන්සේ වි
සින් තමන් ශ්‍රාවකවූ භික්ෂූන්ට නිවාසනපාරුපණ වත සර්ව
ප්‍රකාරයෙන් යහපත්කොට පණවා වදාරණලද්දේය—එම ශි
ක්ෂාපදයන් සම්බන්ධාර්ථයන් ශාරිපුත්‍ර මහාමෞද්ගල්‍යායනාදි
ශ්‍රාවකයන්වහන්සේලා විසින් අවබොධ කොට තත්වූපරිද්දෙ
න් පවත්වනලද ක්‍රමයෙන් මේතාක්ම නානාදෙශයන්හි ස්ථ
විරපරම්පරාගතව පැවතෙන්නේය—එසේම දෙශනා පාලි
හා අර්ථකථා ටීකා ලීනාර්ථ ග්‍රන්ථිපද විවරණයෝද අනූනව
අනෂ්ටව පවත්නාහු වෙති, එහෙසින් ඒ නිවාසනපාරුපණ
වත තත්වූ පරිද්දෙන් දැන පිළිපැදීම සුවසේ කළහැකි වේ—
යම් යම් පරම්පරාවක ඇතැම් පුද්ගලයන්ගේ ශික්ෂාපදයො

ශ්‍රමණීනභාවකින් හෝ නොදැනීමකින් හෝ යම් කලෙක ඒ
පවත්වනලද පිළිවෙළ කඩවී ගවේෂණවශයෙන් පවත්වන
විට අනන්තරසරයෙහි සුපටිච්ඡන්න නොකොට කය විවෘත
කොට හැසිරෙණහෙයින් සුපටිච්ඡන්න කිරීම පිණිස අභිම
තවූ ගණ්ඨිපාසබන්ධනයන් හැර අගණ්ඨිපාසක සඞ්ඝාටිය අං
ශයකින් උසුලා හැසිරීම සවල්පකාලයක් පුරුදුවූහෙයින් ඒ
තමන් කළ සැවිම කාරණු පිණිස කියහැකි අධර්මවූද වචන
මාත්‍රයක්වත් ඇතහොත් එය කියා ධර්මය ප්‍රතිබාහණය
කොට තමන්ගේ අභිමතයම ස්ථිර කරන්නෙම්යි ඊර්ෂ්‍යා උප
දවා, ආධානග්‍රාහී දුප්පටිනිස්සග්ගිව විනය අවිනය කොට
ආපත්ති අනාපත්ති කොට දක්වා නානාවිධ විකාරග්‍රහණය
කොට බන්ධකයට ඇතුළත් ප්‍රඥප්තියත් ප්‍රාතිමෝක්ෂයට
ඇතුළත් ශික්ෂාපදයත් දෙකේ අර්ථය තමන්ගේ ග්‍රහණයට
සමව නොයෙදෙන කල ඛන්ධකයේ අර්ථකථානය මේ පි
ණිස නොකරණලද්දේය, ඒ අනිකක්යයි කියා—තමන්කා
රණාවිධිය සර්වඥයන්වහන්සේ විසින් පණවනලද්දේත් සිඛ
නොවනබව දත්තල අමුතුදෙයද පණවාගෙණ විනයෙහි
නානානයින් කියනලද විස්තරයන්ට මත්තෙහි මිථ්‍යාදෘෂ්ටි
කයන්ගේ වෛදෘග්‍රන්ථයන් සම්බන්ධ පාඨයන් තබා අර්ථ
කථා ටීකාචාර්යයන්ට අපවාද කොට ශේෂාර්ථය ශේෂවශ
යෙන් නොගෙණ ව්‍යඤ්ජනච්ඡායාවෙන් අර්ථ ප්‍රතිබාහණය
කොට සර්වඥයන්වහන්සේ විසින් පණවනලද්දත් නො
පැණවූසේ හඟවා ලොකයා මුළාකොට තමන්ද අනුන්ද
නොනසා සද්ධර්මයද අනන්තර්ධාන නොකොට ප්‍රඥප්ති ශික්ෂාපද
යන්ගේ ව්‍යඤ්ජනාර්ථයහා භාවාර්ථය යථාභූතවශයෙන් ගෙණ
පිළිපැදිය යුතුයි.—

"අසාහසෙන ධම්මෙන සමෙන නයතී පරෙ,
ධම්මස්ස ගුත්තො මෙධාවී ධම්මට්ඨො 'ති පවුච්චති."

මෙ හි භා ව ය.

නිබොරුතෙපුලෙන් විනිශ්චයධර්මයෙන් අපරාබවූ පරිදෙ
න් අනුන් ජයපරාජයට පමුනුවාද විනිශ්චයධර්මය විසින් ර
ක්ෂාකරණලද්දාවූ නුවනැති පුරුෂතෙම විනිශ්චයධර්මයෙහි
පිහිටියේය යි කියනුලැබේ—එසේ නොව අභූතවාදීව ධර්ම
ය අධර්මයකොට විනය අවිනයකොට සවල්පවූ කෙවලවූ ව්‍ය
ඤ්ජනච්ඡායාවකින් නානානය සම්පන්න මහාර්ථයක් ප්‍රතිබා

හාණියකොට ලොව මුළාකරන්නෙක් කෙසේනම් විනිශ්චය ධර්මයෙහි පිහිටියෙක් වේද ?—නොවේමය—

සමන්තභද්‍රවූ සර්වඥයන්වහන්සේ විසින් මෙසේ වදාරණ ලද්දේය—"යෙතෙ භික්ඛවෙ භික්ඛූ දුග්ගහිතෙහි සුත්තන්තෙහි බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථඤ්ච ධම්මඤ්ච පටිබාහන්ති තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනාහිතාය පටිපන්නා, බහුජනාසුඛාය, බහුනො ජනස්ස අනත්ථාය, අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛූ අපුඤ්ඤං පසවන්ති තෙපිමං සද්ධම්මං අන්තරධාපෙස්සන්ති"—මෙහි භාවය—

මහණෙනි යම් ඒ මහණහු පිළිවෙළ වරදවා ගත්නාලද අක්ෂරවිචිත්‍රතාවෙන් ලැබූ සූත්‍රාන්තයන් කාරණකොටගෙණ භාවාර්ථයද ධර්මයද පසුබස්වත්ද, මහණෙනි ඒ භික්ෂූහු බොහෝවූ ජනයාගේ අවැඩපිණිස පිළිපන්නාහුය, බොහෝවූ ජනයාගේ දුකපිණිස පිළිපන්නාහුය, බොහෝවූ ජනයාට අනර්ථපිණිස අවැඩපිණිස දෙවිමිනිසුන්ට දුක්පිණිස පිළිපන්නාහුය. ඒ භික්ෂූහු බොහෝවූ පාපයන්ද රැස්කෙරෙත්. ඔව්හුනුවූ මේ සද්ධර්මයද අතුරුදහන් කෙරෙත්—"අත්ථො අක්ඛරසඤ්ඤුතො" යන කාත්‍යායන සූත්‍රාදියෙන් දක්වනලද ක්‍රමයෙන් ව්‍යඤ්ජනාර්ථාවබෝධය අක්ෂරයන් කාරණකොට ගෙණ කටයුත්තේ වීනමුත්, ව්‍යඤ්ජනාර්ථය ප්‍රතිපත්තිය පිණිස පිරිවහල් නොවේ—භාවාර්ථාවබෝධය පිරිවහල් වේ—"අත්ථං හි නාථො සරණං අවොච න බ්‍යඤ්ජනං ලොකහිතො මහෙසී, තස්මා අකත්වා මතිමක්ඛරෙසු අත්ථෙ නිවෙසෙය්‍ය මතිං මුතිමා—භාවය—ලොකහිතවූ මහර්ෂිවූ සර්වඥයන්වහන්සේ අර්ථය සරණකොට වදාළසේක, ව්‍යඤ්ජනය සරණකොට නො වදාළසේක, එහෙයින් නුවණැත්තේ අක්ෂරයන් කෙරෙහි මතිය නොකොට මතිය අර්ථයෙහි යොදන්නේය—

---

එහෙයින් සර්වඥදෙශිත ප්‍රඥප්තින් සම්බන්ධවූ ව්‍යඤ්ජනයන් කාරණකොටගෙණ වචනාර්ථය සලකා භාවාර්ථය ගරුකොටගතයුත්තේය—එසේනොව යම්කිසි ව්‍යඤ්ජනච්ඡායාවකින් අර්ථය ධර්මය වසා අධර්මයක් ධර්මය කොට අවිනයක් විනයකොට යම් භික්ෂූහු දක්වත්නම් ඒ භික්ෂූහු—"යෙතෙ භික්ඛවෙ භික්ඛූ අධම්මං ධම්මොති දීපෙන්ති අවිනයං විනයොති දීපෙන්ති"—යනාදීන් මහත්වූ පාපයක් රැස්කොට අපායභාග්වනබැව් බුද්ධදෙශනාවෙන් දැන භික්ෂූන්ට සර්වඥයන්වහන්සේවිසින්

චීවරනිවාසනපාරුපණය කෙසේ පණවන ලද්දේද, ඒ වදාළ ක්‍රමය නොඉක්මවා භික්ෂූන්විසින් කෙලෙස පුරුදුකරණ ලද්දේදැයි සාධූන්විසින් සාවධානව අසා මෙනෙහි කටයුතු; මෙනෙහිකොටද අවබොධවූ පරිදෙන් අනුන්ටද කියයුතුයි-සිතේ එකක් තබාගණ අනුන්ට අනිකක් කියා තමා නොනැසිය යුතුයි ෴ සවාසනා සකලක්ලෙශයන් නසා සර්වඥපදප්‍රාප්තවූ සර්වඥයන්වහන්සේගේ ශාසනයට තෘතාධිකාරවූ කුලපුත්‍රයන් ඇතුළත්වනකල්හි, සරණගමනයෙන් උපසම්පදාව දෙවාවදාරණකල්හි කුලපුත්‍රයන් සරණගමනයට පත්කරණ පරිදි දෙශනා කර වදාරන්නේ මෙසේ වදාලසේක ෴

"පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදාපෙත්වා එකංසං උත්තරාසඞ්ගං කාරාපෙත්වා භික්ඛූනං පාදෙවන්දාපෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිම්පග්ගණ්හාපෙත්වා එවං වදෙහීති වත්තබ්බො" ෴ මෙහි භාවය—(පැවිදි උපසම්පදා පතන පුද්ගලයා) පළමුකොට කෙස් රැවුලු හරවා කසාපිළි හඳවා පොරවණය එකාංසකරවා භික්ෂූන්ගේ පා වඳවා උක්කුටිකයෙන් හිඳුවා ඇදිළි බඳවා මෙසේ කියවයි කියයුත්තේය ෴

මෙහි දක්වනලද උත්තරාසඞ්ගය ඒකාංශකිරීම වැඩිසිටියන් වඳනාකාලයෙහි සකස්කොට පෙරවීමවශයෙන් නියමකර වදාණලද්දේය. වරදවූ ආකල්පයක් වලක්වනප්‍රඥප්තිස පණවන ලද ශික්ෂාපදයක් නොවන්නේය ෴ යම් ගිහිඋපාසකයෙකු විසින්ද භික්ෂූන්කරා පැමිණ යාච්ඤාවක් කරණකල්හිද තමන් උත්තරාසඞ්ගය ඒකාංශකොට පොරවා වැන්දයුත්තේය ෴

එය විශෙෂයෙන් ප්‍රකාශවේ—ඒ මෙසේයි—"තෙන භික්ඛවෙ වඩ්ඪෙන ලිච්ඡවිනා සඞ්ඝං උපසංකමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භික්ඛූනං පාදෙවන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො"—මෙහි භාවය-

මහණෙනි ඒ වඩ්ඪනම් ලිච්ඡවීහුවිසින් සඞ්ඝයාකරා එළැඹ පොරවණය එකාංසකොට භික්ෂූන්ගේ පා වැඳ උක්කුටිකයෙන් හිඳ ඇදිලිබැඳගෙණ මෙසේ කියයුතු වන්නේය—මෙයින් ගිහිඋපාසකයෙකු විසින්ද භික්ෂූන් වඳනාකල්හි පොරවණය ඒකාංශකොටගෙන වැන්දයුතුබව හැඟේ ෴ එසේ උත්තරාසඞ්ගය ඒකාංසකිරීමම භික්ෂූන් ඇතුඵගම් වඳනාකල්හි කටයුතු පෙරවීමයයි බුදුන් අනුදන්නාලද්දේයයි යමෙක් කියානම් ඒ අධර්මවාදී බව සැකහැර දතයුතුයි ෴

# උත්තරාසඞ්ගස්සකංසකරණකථා.

## 2

සර්වඥයන්වහන්සේ විසින් භික්ෂූන්ගේ නිවාසනයට හෙවත් ඇඳිමපිණිස ශික්ෂාපද පැණවීමට පූර්වකාලයෙහි උපාධ්‍යාය ග්‍රහණය නොකළ භික්ෂූන් නපුරුකොට හැඳ පොරවා හැසුරුණුබැව් මහාස්කන්ධකයෙහි ප්‍රකාශයි—එසේවූ කල්හි උපාධ්‍යායග්‍රහණය අනුදැනවදාරා උපාධ්‍යායයන්ට පසුව යන ශ්‍රමණයෙක්ව ඇතුළුවීගමට යායුතු පරිදි මෙසේ දෙශනාකරවදාරණ ලද්දේය—"සචෙ උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං"—මෙහි භාවය—

ඉදින් (ගම්වදනා) උපාධ්‍යායතෙම පසුව යන ශ්‍රමණයෙකු රුචිකෙරේද තෙමඬුළු වසන්නාහු විසින් පිරිමඬුළුකොට හැඳනය හැඳ කායබන්ධනය බැඳ සඞ්ඝාටිය හා උත්තරාසඞ්ගය යන සිවුරුදෙක එකටඅල්ලා පොරවා ගණ්ඨිය අමුනා සෝදා පාත්‍රය ගෙණ උපාධ්‍යායයන්ට පසුවයන ශ්‍රමණයෙක් වියයුතුයි—මේ ඛන්ධකයෙහි ආ නයයි-විභඞ්ගයෙහි ආ ක්‍රමයනම්, සර්වඥයන්වහන්සේ සැවැත්නුවර වැඩවසනකල්හි සවගමහණුන් ඉදිරියෙන්ද පස්සෙන්ද එල්ලා අඳනය හැඳි හෙයින් එය නිදානකොට හඳනය හැඳිමපිණිස සෙඛියාවේ පළමුවෙනි ශික්ෂාපදය පණවාවදාළසේක—ඒ මෙසේයි—"පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛාකරණීයා"—භාවය, හාත්පසින් මඬුළුකොට හඳින්නෙමියි ශික්ෂාව කටයුතුනීය—"පරිමණ්ඩලං නිවාසෙතබ්බං නාභිමණ්ඩලං ජාණුමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන, යො අනාදරියං පටිච්ච පුරතොවා පච්ඡතොවා ඔලම්බෙන්තො නිවාසෙති ආපත්ති දුක්කටස්ස"—භාවය-නැබමඬලද දනමඬලද වසන්නාහු විසින් පිරිමඬුළුකොට හැන්දයුතුයි, යමෙක් අනාදරපිණිය ඉදිරියෙන් හෝ පස්සෙන්හෝ එල්වා අඳිද ඔහුට දුකුලාඇවැත් වේ—මෙහි ජාණුමණ්ඩලං යනුදු එකවචනයි—නුමුත් ජාතිසාමාන්‍යයෙන් දනමඬුළුදෙකම වසා හඳනය හැන්දයුතුය යනු භාවාර්ථයි—දෙදනමඬුළු කොපමණකින් වැසියයුතුදයත්—සමන්තපාසාදිකා

වෙහි—"ජානුමණ්ඩලස්ස හෙට්ඨා ජඞ්ඝට්ඨිකතො පට්ඨාය අට්ඨ
ඞ්ගුලමත්තං නිවාසනං ඔතාරෙත්වා නිවාසෙතබ්බං"-භාවය-
දනමඬලට පාත කෙණ්ඩාඇටය පටන් අටඟුලක්පමණ
හඳනය පාත්කොට හැඳිය යුතුයි—මෙසේ අඳින්නාහුගේ හඳ
නය ප්‍රමාණයෙන් යුක්තවූයේම වටී—ඒ ප්‍රමාණයනම්—සම
න්තපාසාදිකාවෙහි—"තත්‍රිදං පමාණං දීඝතො මුට්ඨිපඤ්චකං
තිරියං අඩ්ඪතෙය්‍යහත්ථං, තාදිසස්සපන අලාභෙ තිරියං ද්වි
හත්ථප්පමාණම්පි වට්ටති ජානුමණ්ඩල පටිච්ඡාදනත්ථං, නාභි
මණ්ඩලං පන චීවරෙනාපි සක්කා පටිච්ඡාදෙතුන්ති"—ඒ අඳ
නයෙහි මේ ප්‍රමාණයි—දිගින් මිටි පස්රියණයි—සරස දෙරි
යන් සමාරයි—එබන්දක් නොලැබීමෙහි වනාහි සරස දෙරි
යන්පමණ වූයේද දනමඬල වසනපිණිස වටී—නැබමඬල ව
නාහි චීවරයෙන්ද වසනුහැක්කේයි— ශික්ෂාපදඅර්ථ කථාදිය
මෙසේහෙයින් යමෙක් මෙහි ජානුමණ්ඩලං යන එකවචන
යෙණ ව්‍යඤ්ජනයෙහි එල්බී මේ ජානුමණ්ඩලං යන්නෙන්
කියනලද්දේ එකදනමඬලය එහෙයින් එකදනමඬලක් වසා
හැන්දකල්හි පරිමණ්ඩලනිවාසනය වෙයි කියාහෝ—ඈතිස
ඳැඳිය වසන්නව එහි නොකියනලද්දේය එහෙයින් පිප්පස
ඈතිසඳැඳිය නොවසාම පරිමණ්ඩල නිවාසනය කටයුතුයයි
කියානම් ඒ විනය අවිනයකරන්නේ වේ—නාභිමණ්ඩලයහා
දෙදනමඬුළු නොහොත් අවශ්‍යයෙන්ම දෙදනමඬුළුවසා
කෙණ්ඩාඇටය පටන් පාතට අටඟුලක් හෙළා කොන් නො
එල්ලා අවටින් මඬුළුකොට හැන්දකල්හි ගජසොණ්ඩක ම
ච්ඡවාලාදි ගිහිනිවාසන දොස් නැතිකොට හැන්දවේ—මෙහි
වනාහි—"නාභිමණ්ඩලං පන සක්කා චීවරෙනාපි පටිච්ඡාදෙ
තුං"—නැබමඬල වනාහි (පොරවන) සිවුරෙනුත් වසනුහැකි
යයි කියනලදහෙයින්—දෙදනමඬුළු පොරවන සිවුරෙන් වැ
සීම අවශ්‍යනොවේ—ඒ යථාලාභවශයෙන් වේ—නැබමඬල
හඳනයෙන් වැසීම අවශ්‍යනොවේ—එය පොරවන සිවුරෙන්
වැසීම අවශ්‍යයි—

## පරිමණ්ඩලනිවාසනකථා.

---

## 3

පරිමණ්ඩල පාරුපණය සෙඛියාවේ දෙවෙනි ශික්ෂා පද
යෙන් වදාරණලද්දේය-ඒ කෙසේදයත්—සර්වඥයන්වහන්සේ

සැවැත්නුවර දෙව්රම්වෙහෙර වැඩවසනකල්හි සවගමහණ හු ඉදිරියෙන්ද පස්සෙන්ද එල්ලා සිවුරු පෙරවූහ-එය නිදුන කොට හාත්පසින් මඬුළුඇතිකොට ගිහිපාරුපණක්‍රම දුරු කොට පොරවණ පිණිස සෙඛියාවේ පළමුවෙනි වර්ගයේ දෙවෙනි ශික්ෂාපදය පණවා වදාළසේක—පවිතිපොතෙහි-"පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා"-මෙහි භාවය-හාත්පසින් මඬලයක් ඇතිකොට පොරවන්නෙමි යි ශික්ෂාව කටයුතුනීය—"පරිමණ්ඩලං පාරුපිතබ්බං උභොකණ්ණසමං කත්වා, යො අනාදරියං පටිච්ච පුරතොවා පච්ඡතොවා ඔලම්බෙන්තො පාරුපති ආපත්ති දුක්කටස්ස"—භාවය—දෙකොණ සමකොට අවටින් මඬුළුඇතිකොට පෙරෙවිය යුතුයි—යමෙක් තෙම අනදරපිණිස ඉදිරියෙන්හෝ පිටිපසින් හෝ එල්වමින් පොරවාද ඔහුට දුකුළා ඇවැත් වේ—පරිමණ්ඩල කාරණය නම් අවටින් මඬලක් කිරීමයි—එය දෙකොණ සමකිරීමෙන් කටයුතුයි—මීට සමන්තපාසාදිකා නම් අටුවාවේ මෙසේ දක්වනලදී—"තෙනඛොපන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු ගිහිපාරුතං පාරුපන්තී ති එවං වුත්තං අනෙකප්පකාරං ගිහිපාරුතං අපාරුපිත්වා ඉධ වුත්තනයෙනෙව උභොකණ්ණං සමං කත්වා පාරුපණවත්තං පූරෙන්තෙන පරිමණ්ඩලං පාරුපිතබ්බං"—භාවය—එකල්හි වනාහි සවගමහණ්හු ගිහිපෙරවුම් පොරවතිසි මෙසේ කියනලද නොයෙක් ආකාරවූ ගිහිපෙරවුම් නොපොරවා මේශික්ෂා පදයෙහි කියනලද ක්‍රමයෙන්ම දෙකොණ සමකොට පොරවණවත පුරන්නාහුප්සින් හාත්පසින් මඬුළු ඇතිකොට පෙරවිය යුතුයි-මේ පරිමණ්ඩලපාරුපණශික්ෂාපදයෙන්, ඉදිරියෙන්හෝ පිටිපසින්හෝ එල්වා පෙරවීම වලක්වන ලද්දේය—කය විවෘත කිරීම නොවලක්වන ලද්දේය—මේපරිමණ්ඩල නිවාසන පාරුපණදෙකට පණවාවදාළශික්ෂා පදදෙක සාමාන්‍යයෙන් වදාරණලද්දේය—ඇතුළුගම යනාදිවශයෙන් ස්ථාන නියමයක් මීට නොකරණලද්දේය—ස්ථාන නියමවශයෙන් වදාරණලද ශික්ෂාපදයෝ මින්මතෙතහි වෙති—ඉන්නිසා සමන්තපාසාදිකාවේ මෙසේ දක්වනලද්දේය—"ඉමානි වෙ සික්ඛාපදානි අවිසෙසෙන වුත්තානි, තස්මා විහාරෙපි අන්තරඝරෙපි පරිමණ්ඩලමෙව නිවාසෙතබ්බං පාරුපිතබ්බඤ්චාති"—භාවය—මේ ශික්ෂාපදදෙක අවිශෙෂයෙන් වදාරණලද්දාහුය, එහෙයින් විහාරයෙහි හෝ අන්තරඝරයෙහි හෝ හාත්පසින් මඬුළු කොටම හැඳිය යුතුද පෙරවියයුතුද වෙයි—මෙයින් විහාර

යෙහිදී අඳනය ඇඳීමෙහිද ගම්වදනාකල අඳනය ඇඳීමෙහිද ඉදිරියෙන් පස්සෙන් කොන් නොඑල්ලා හැඳියයුතුබවද, විහාරයෙහිදී එකාංශකොට කටයුතුවූ පෙරවීමෙහිද ඇතුළු ගම් වදනා කල්හි සුපටිච්ඡන්නකිරීමෙහිද හාත්පසින් මඬුලු ඇතිකිරීම කටයුතු බැව් භගවනලදී-විනයවිනිශ්චයෙහි.

"උභොකණ්ණං සමං කත්වා සාදරං පරිමණ්ඩලං,
කත්වා පාරුපිතබ්බෙවං අකරොන්තස්ස දුක්කටං"-භාවය-

දෙකොණ සමකොට ආදරසහිතව, හාත්පසින් මණ්ඩලයක් කොට පෙරවිය යුතුයි—මෙසේ නොකරන්නාහට දුකුළා ඇවැත් වේ—මේ පෙරවීමේදී දෙකොණ සමකරණ පරිදි විනයවිනිශ්චය ටීකාවෙහි මෙසේ කියනලදී—"උභොකණ්ණං සමංකත්වාති පාරුපණස්ස එකංසෙ කතස්ස පිට්ඨිපස්සෙ උදරපස්සෙච ඔලම්බමානෙ උභො කණ්ණෙ හත්ථිපිට්ඨෙ සණ්ඨාපිය සමං කත්වා"—භාවය—උභොකණ්ණං සමංකත්වා යනමෙහි භාවයනම්, එකාංශයෙහි කරණලද පාරුපණයාගේ පිටිපසද බඩපසද එල්ලෙන්නාවූ දෙකොණ ඇතුපිට මිනිගෙඩිමෙන් සමකොට යනුයි—මෙහි පොරවණ උත්තරාසඞ්ගයේ දෙකොණ සමකිරීම කියන ලද්දේයි—සඞ්ඝාටිය පෙරවීමක් නොකියනලද්දේයි—තුන්වෙනි ශික්ෂාපදයෙහි කියනලද දෙකොණ සමකිරීම මෙසේනොවේ—එය ශික්ෂාපද වණ්ණනාවෙන්ද ඛන්ධකට්ඨකථායෙන්ද මතු දක්වනු ලැබේ—තවද, විනයවිනිශ්චයෙහි.

"අවිසෙසෙන වුත්තත්තා ඉදං සික්ඛාපදද්වයං,
තස්මා ඝරෙ විහාරෙවා කත්තබ්බං පරිමණ්ඩලං."

භාවය—(පරිමණ්ඩලනිවාසන පරිමණ්ඩලපාරුපණ දෙකට පැණවූ) මේ ශික්ෂාපද දෙක ස්ථානවිශෙෂ නියමනොකොට සාමාන්‍යයෙන් වදාරණලද්දේය, එහෙයින් අන්තරඝරයෙහි හෝ විහාරයෙහි හෝ පිරිමඬුලු හෙවත් හාත්පසින් මණ්ඩලය ඇතිකිරීම කටයුතු—මෙහි විහාරයෙහි පිරිමඬුලු කිරීම කෙබඳු තන්හිද කවරකල්හිදැයි ටීකාවෙහි නියමකොට තිබේ—ඒ මෙස්සි—"විහාරෙති බුද්ධුපට්ඨානාදිකාලං සන්ධාය වුත්තං, පරිමණ්ඩලං කාතබ්බන්ති පරිමණ්ඩලමෙව නිවාසෙතබ්බං පාරුපිතබ්බඤ්චාති අත්ථො"—විහාරයෙහියයි බුද්ධොපස්ථානාදිය කරණ කාලය සඳහා කියනලද්දේය—පිරිමඬුළු

කටයුතුය යනු හාත්පසින් මඬුළුකොටම හැන්දයුතුය පෙ
රවියයුතුද වෙති යන අර්ථයි—ඉදිරියෙන් පස්සෙත් කොන්
නොඑල්ලා ගැඳිම්පෙරවීම්කෙරීම ඇතුළුගමද විහාරයෙහිද
කටයුතුමයි-එල්ලීමෙන් එකදෙසක උස්ව අන්දෙසක පහත්ව
තිබේනම් ඒ පිරිමඬුලු නොවේ-පිරිමඬුලුකිරීම එකාංසපාරුපණ
යටද සුපටිච්ඡන්නපාරුපණයටද සාධාරයි-එසේ නොඑල්ලා
හැඳීමද පෙරවීමද ඇතුළුගමදීහෝ විහාරයෙහිදීහෝ කටයුතු
යයි නියමකළ හෙයින් විහාරයෙහිදී පෙරවීමත් ගම්වැදීමෙ
හිදී පෙරවීමත් එකමයයි යමෙක් කියානම්-හෙතෙම ධර්මය අ
ධර්මයයි විනය අවිනයයි කීයේ නොවේද?—වේමය—මේ
කියනලද එකාංසපෙරවීමට ගණ්ඨිපාස ඇමිනීමක් නියමකො
ට නැත්තේමය-තුන්වෙනි ශික්ෂාපදයෙන් දක්වනලද ගම්වැ
දීමේදී පෙරවීම-"ගණ්ඨිකංපටි මුඤ්චිත්වා"-යනාදීන් ගණ්ඨිය ඇ
මිනීම මුල්කොටම දක්වනලද්දේය-මේ ශික්ෂාපදයේ පදභාජ
නියාදියෙහි කයවිවෘත කිරීමට ඇවතක් නොදක්වන ලද්දේ
ය-මෙමවර්ගයේ තුන්වෙනි ශික්ෂාපදයේ කයවිවෘත කොට
ඇතුළුගමයන්නාහට දුකුළාඇවැත් දක්වනලදී—තවද මෙ
කී එකාංශපරිමණ්ඩල පාරුපණයකිරීමෙහි ග්‍රීවයවසන්නට නි
යමනොකරණ ලද්දේය, මණිබන්ධය වසන්නට නියම නො
කරණ ලද්දේය, ජත්‍රුදෙකද උරයද වසන්නට නියම නො
කරණලද්දේය, මෙකී සියළු අවයව වසන්නටද, නොවසන්
නාහට ඇවැත්ද මෙමවර්ගයෙහිවූ තුන්වෙනි ශික්ෂාපදයෙන්
නියම කරණලද්දේය—මෙසේ තිබියදීම මෙකී දෙවෙනි
ශික්ෂාපදයෙන් බුද්ධොපස්ථානාදිය කරණකල්හි නියමකළ
එකාංශපරිමණ්ඩලපාරුපණයම ගම්වැදීමේදීද කරන්නට නි
යමකරණලද්දේයයි සිහිඇතිකවරෙක්නම් කියාද, නොකියා
මය—මේ සෙඛියාවේ පළමුවෙනිවර්ගයේ දෙවෙනිවූ ප
රිමණ්ඩලපාරුපණශික්ෂාපදයෙන් බුද්ධොපස්ථානාදිකාලයන්
හි පරිමණ්ඩලකටයුතුබැව් නියමකළ පෙරවීමම ඇතුළුගම්වද
නාකල්හිද එසේම කටයුතුය ඒ දෙතන්හිම එකාකාරපෙරවී
මයයි යමෙක් කියානම් ඔහුවිසින්ම ඒ විහාරයෙහිදී බුද්ධො
පස්ථානාදිය කරණකල්හිදු ගණ්ඨිය ඇමිනියයුතුබවක්ද
මණිබන්ධය වැසියයුතුබවක්ද ජත්‍රුදෙකහා උරය වැසිය
යුතුබවක්ද කයවිවෘත නොකටයුතුබවක්ද දේශනාට්ඨකථාදි
යෙන් දැක්වියයුතුමය—එසේ නොදක්වනතෙක් ඔහුගේ ඒ
කීම මුසාවාදයක්බව නුවනැත්තෝ සිතත්මය.

# පරිමණ්ඩලපාරුපණකථා

## 4

සුප්පටිච්ඡන්නකොට යාම ගම්වදනාකලට නියමකරණලදී- ඒ කෙසේදයත්—සෙඛියාවේ දෙවෙනි ශික්ෂාපදයෙන් පිරිමඩුලුකොට පෙරවීමද අවිශෙෂයෙන් වදාරණලදෙද් නමුත් එකල කය විවෘතකොට යාම තහනම් කොට ශික්ෂාපදයක් නොපණවන ලදෙද්මය—කය විවෘතකොටයාම අයොග්‍ය වන්නේ ගිහිගෙවලට ගෙවත් ඇතුළුගමට යනකල්හිය—ඒඑසේනමුත් එය තහනම්කළ ශික්ෂාපදයක්නැති හෙයින් සවගම්භණ්ණු කය විවෘතකොට ඇතුළුගමද ගියානුය—ඒ බැව් පච්ඡිපොතෙහි මෙසේ පෙණේ—"තෙනඛොපණසමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති"—එකල්හිවනාහි සවගම්භණ්ණු කය විවෘතකොට ඇතුළුගම යති—මේ කය විවෘතකොටය කීවේ කුමක් නොවසා විවෘතකළාවද යත්,—සමන්තපාසාදිකාවෙහි මෙසේ පෙණේ—"කායං විවරිත්වාති ජණ්ණුම්පි උරම්පි විවරිත්වා"—භාවය—කය විවෘතකොට යන්නේ අසීයනම් අංසකූටයද ලැපැතන හෝ ලැපැත්තේ අංසයක්ද නොවසාය යන අසීයි—අන්තරඝරයෙහි කය විවෘතකිරීම කෙලෙසය පෙරවීමෙන් වේදැයි ගඟවනු පිණිස විමතිවිනොදනියෙහි එකාංශ පෙරවීම කය විවෘතකිරීමයයි කියණලදී—එය මනු දක්වනු ලැබේ—සවගම්භණ්ණුන් එකාංශකොට පොරවා ඇතුළුගමෙහි ගිය හෙයින් ඒ වලක්වනුපිණිස මේ තුන්වෙනි ශික්ෂාපදය පණවා වදාළබව ප්‍රකාසකරණලද්දේය—මෙසේ එකාංශකොට පෙරවීමෙන් කය විවෘතකොටගෙණ ෂඩ්වර්ගීන භික්ෂූන් ඇතුළුගම ගිය කාරණ නිදානකොට සර්වඥයන්වහන්සේ විසින් සෙඛියාවේ පළමුවෙනිවර්ගයේ තුන්වෙනි ශික්ෂාපදය පණවන ලද්දේය—ඒ ශික්ෂාපදය පච්ඡිපොතෙහි මෙසේ පෙණෙන්නේය—"සුප්පටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛාකරණීයා"—භාවය—මනාකොට (සිවුරෙන්) කය වසන ලද්දේ ඇතුළුගම යන්නෙමියි ශික්ෂාව කටයුතුයි—"සුප්පටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං යො අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස"—මනාකොට කය වසනලද්දහු විසින් ඇතුළුගම යා යුතුයි—යමෙක්

අනදර්පිණ්ඩිස කාය විවෘතකොට නොහොත් ජත්‍රුද අංශ
යද විවෘතකොටගෙණ ඇතුළුගම යේද දුකුලාඇවැත් වේ—
මීට පූර්වූ පරිමණ්ඩලපාරුපණ ශික්‍ෂාපදයෙන් අනාදරයෙන්
ඉඳිරියෙන්ද පස්සෙන්ද එල්ලා පොරවන්නාහට ඇවැත් ද
ක්වනලදී—එහි කාය විවෘතකරන්නාහට ඇවැත් නොදක්ව
නලදී—මේ තුන්වෙනි ශික්‍ෂාපදයෙන් වනාහි ඇතුළුගමේදී
කාය විවෘතකරන්නාහට ඇවැත් දක්වනලදී—පරිමණ්ඩලනි
වාසන, පරිමණ්ඩලපාරුපණ දෙකම ස්ථාන විශේෂයක් නො
කොට සාමාන්‍යයෙන් නියමකරණ ලද්දේය—මේ සුප්පටිච්ඡ
න්නපාරුපණය විශේෂවශයෙන් ඇතුළුගමට නියමකරණ
ලද්දේය—මනාකොට කාය වසන පිළිවෙළ නොහොත් ම
නාකොට කාය වසාගෙණ ඇතුළුගම යන ක්‍රමය සමන්තපා
සාදිකාවෙහි මෙසේ දක්වන ලද්දේය—"සුපටිච්ඡන්නෙනා
ති නසසීසං පාරුතෙන අථබො ගණ්ඨිකං පටිමුඤ්චිත්වා අනුවාත
න්තෙන ගීවං පටිච්ඡාදෙත්වා උභොකණ්ණෙ සමං කත්වා
පටිසංහරිත්වා යාවමණිබන්ධං පටිච්ඡාදෙත්වා අන්තරඝරෙ
ගන්තබ්බං"—භාවය—මනාකොට වසනලද්දහු විසින් යනු හි
සවසා පොරවනලද්දහු විසින් නොව, යලිත් ගණ්ඨිය (පාස
යෙහි) අමුනා නුවාවේ අන්තයෙන් ග්‍රීවය වසා දෙකොණ
සමකොට පස්සට අකුලා නොහොත් පසසට එකතුකොට
ගෙණ මැණික්කට්ටුව දක්වා කාය වසාගෙණ ඇතුළුගම යා
යුතුයි--මෙහි ග්‍රීවය වසන්නට කිහෙයින්, ඒකාංශකොට පෙ
රවීමම සුපටිච්ඡන්නායයි කියන්නන්ගේ අධම්වාදය ඊට නො
ගැළපෙණහෙයින් ග්‍රීවය අතිකාක්කොට අගවන්නට උත්සා
හ කරති—එනම්, උගුරමුල උගුරු වළය යනුයි—එය නිසි
ම්හිස්සිහියක් ඇත්තෙක් විශ්වාස නොකරති—ග්‍රීවය බෙරය
කට උපමාකරණලද්දේය—"කම්බුගීවා තු යා ගීවා සුවණ්ණා
ලිඩගසන්නිභා"—යනාදියෙන්ද එය ප්‍රකටයි—එකම ග්‍රීවයේ
අස්ථි සතක් තිබෙනබව විශුද්ධිමාර්ගයෙහි—"සත්තගීවට්ඨීනි"-
යනාදීන් දක්වනලද්දේය—ග්‍රීවයතුළ මූලපටන් හිස්කබල
පිහිටිතැනට යනතෙක් අස්ථි සතක් පිහිටා තිබේ—ඒ අස්ථි
සතකින් යුක්තව පිහිටා තිබෙන ග්‍රීවය පිට කිසිතැනක් ඇතු
ළුගම් වදනාකල්හි නොවසා යන්නට අවසර නොදෙනලද්
දේය—පිටිපසින් උකුණුවල දක්වාද ඇතුළුපසින් තිස්ම තී
බෙන ඇටය දක්වාද වසන්නට නියමකරණලද බැව් මතු
දක්වන්නෙමු—විනය විනිශ්චයෙහි.

ගණ්ඨිකං පටිමුඤ්චිත්වා කත්වා කොණෙ උභො සමං
පාදෙත්වා මණිබන්ධම්ව ගන්තබ්බං ගීව මෙවච.

තථා අකත්වා භික්ඛුස්ස ජත්තුනිපි උරම්පිච
විවරිත්වා යථා කාමං ගච්ඡතො හොති දුක්කටං.

භාවය—ගණ්ඨිය අමුනා දෙකොන් සමකොට මැණික්කටු
වුවදක්වාද, ග්‍රීවයද වසා ඇතුළුගම යා යුතුයි—එසේ නො
කොට අංසකූට හෙවත් උරහිස්දෙකද උරය හෙවත් අංස
යක්ද නොවසා කැමතිපරිද්දෙන් ඇතුළුගම යන්නාවූ භික්ෂු
හට දුකුළාඇවැත් වේ—අටුවාහි "ජත්තුම්පි" කීතැනත් වින
යවිනිශ්චයෙහි "ජත්තුනිපි" කීතැනත් ජත්තුශබ්දය අංසස
න්ධිආදී නානාර්ථයෙහි පවත්නා හෙයින්ද, උරශබ්දයේ නා
නාර්ථඇති හෙයින්ද ටීකාචාර්ය්‍යයන් විසින් මෙහි ශික්ෂාපදය
පිළිබඳවූ ජත්තුශබ්දයේද උරශබ්දයේද ලීනාර්ථ කථනය ක
රණලදී—එය ඒකාලයෙහි භික්ෂූන්ගේ පෙරවීමද බලා ලියා
තබනලද බව ශඞ්කාරහිතවම දතයුතුයි—ටීකාවෙහි මෙ
සේපෙණේ—"ජත්තුනිපීති උභොඅංසකූටානි, උරම්පිචාති
අංසම්පි"—භාවය—"ජත්තුතිපි" යනමෙහි අර්ථයනම් අංස
කූට දෙකද යනුයි—"උරම්පිච" යනමෙහි අර්ථයනම් අංස
යද යනුයි—අංසකූට දෙකද අංසයද නොවසා ඇතුළ්ගම
යන්නාහට දුකුළාඇවැත් දක්වනලදී—මෙහි කියනලද අං
සකූටශබ්දයෙන් ග්‍රීවයට පාත ලැපැත්තේ තිබෙන ගලසර
ඇටදෙකේ කොන්දෙක කියනලදැයි සමහර සත්පුරුෂයෝ
කියත්-ඒ කුමක්කියා හෝ ඒකාංශපාරුපණය සුපටිච්ඡන්න
පාරුපණයයි භගවන අදහසින් කියනුලබන්නකි—ගලසර
ඇට කොන්වලට අංසකූට නාමයක් මාගධිකභාෂාවේ නැ
ත්තේය—දීඝනිකායාර්ථකථාවෙහි—"පච්චග්ඝං සෙලමයං
පත්තං වාමංසකූටෙ ලග්ගෙත්වා"—මෙහි භාවය—මාහැඟිවූ
ශෛලමය පාත්‍රය වම්අංශකූටයෙහි හෙවත් වම්උරහිසෙ
හි එල්වා—ඒ කියන්නාවූ සත්පුරුෂයෝ මෙකී තත්හිද අංස
කූටශබ්දයෙන් කියනලද්දේ ලැපැත්තේ තිබෙන ගලසර
ඇටයේ පාත කොණයයි කියන්නට සිතත්යයි තවරෙක්
සිතාද?—එසේනම් පාත්‍රය ඒ ගලසරඇට කොණේ එල්වූයේ
යි සිතිනුත් සිතා කියත්ද?—ඒ එල්ලූවේ කෙසේද?—ඇනයක්
ගසාලායයි කියත්දැයි කිහිය යුතුයි—තමන් කී යම් අධර්මය
ක් දැඩිකරන්ට නොසිතා වම් අංසකූටයයි කියනලද්දේ වම්

උරහිසයයි යථාභිවශයෙන් සිතාගත්විට පාත්‍රය වම්උරහි
සෙස් එල්වූබව හැගේ—එසේහෙයින් වසත්නට නියමකළ
අංසකූටදෙකනම් උරහිස්දෙකයයි තේරුම්ගත්කල්හි කිසිම
විපරීතග්‍රහණයක් නොවේ—තවද, සමන්තපාසාදිකාවෙහි-
"යථාච එකච්චෙ පරිබ්බාජකා උරං විවරිත්වා උභොසු අංස
කූටෙසු පාරුපණං ඨපෙන්ති"—භාවය—යම් පරිද්දෙකිනුත්
ඇතම් පරිබ්‍රාජකයෝ වක්ෂස එලියේ තබා අංසකූටදෙක්හි
පොරවණය තබද්ද—මෙහි කියනලද අංසකූටදෙක බෙල්
ලට පාතින් තිබෙන ගලසරඇට දෙකේ පාත් කොන්දෙක
දැයි සිතිය යුතුද?—ඒ එසේනම් ඒ දෙකේ පාරුපණය කෙලෙ
සකින් තබද්දැයි සිතා වක්ෂස විවෘතකොට උරහිස් දෙක්හි
පොරවණය තබත්යයි අවිපරීතකොට සිතියයුතුයි—තවද
එහිම—"යථාච එකසාටකා මනුස්සා නිවත්ථසාටකස්ස එකෙ
න අන්තෙන පිට්ඨිං පාරුපිත්වා උභො කණ්ණෙ උභොසු
අංසකූටෙසු ඨපෙන්ති"—භාවය—යම්සේත් එකසාටකමනු
ෂ්‍යයෝ හඳනාලද වස්ත්‍රයාගේ එක් අන්තයකින් පිට පොර
වා කොන්දෙක අංසකූට දෙක්හි හෙවත් උරහිස් දෙක්හි
තබද්ද—"යථාච බ්‍රාහ්මණා උභින්නං උපකච්ඡකානං අන්ත
රෙන සාටකං පවෙසෙත්වා අංසකූටෙසු පක්ඛිපන්ති"—භා
වය—යම්සේත් බ්‍රාහ්මණයෝ කිසිලිදෙක අතරෙන් වස්ත්‍රය
ප්‍රවිෂ්ටකොට අංසකූටයන්හි හෙවත් උරහිස්හි තබද්ද—"යථා
ච පාලිකාරකො භික්ඛු එකංසපාරුපණෙන පාරුතං වාමබා
හං විවරිත්වා චීවරං අංසකූටං ආරොපෙති"—භාවය—යම්සේ
ත් පාලිකාරකභික්ෂුතෙම ඒකාංශපාරුපණයෙන් පොරවණ
ලද වම්බාහුව විවෘතකොට සිවුර අංසකූටයට හෙවත් උර
හිසට නගාද—යනාදීන් කියනලද තන්හි අංසකූටයයි කිය
නලද්දේ ලැපැත්තේ තිබෙන ගලසරඇට පාතකොන්යයි
ගතහොත් එතැන සිවුරු තබන්නට ආරොපණය කරන්න
ට නොහැකිබැවින් අංසකූටය කියනලද්දේ ගලසරඇට පා
තකොත් නොවෙයි උරහිස්යයි ඒ පින්වත්හු මෙනෙහිකෙ
රෙත්වා—තවද, විනයවිනිශ්චය ටීකාවෙහි—"උරම්පිවාති අං
සම්පි"—යන ලීනාත්ථවණ්ණනාවේ පාඨය එසේනොවෙයි—
"උරම්පිවාති හදයම්පි"—කියාවෙයි ඇතම් පින්වත්හු කියති-
උරම්පිච යන්නට හදයම්පි යනු ලීනාත්ථවණ්ණනාවක් වේදැයි
පණ්ඩිතයෝ මෙනෙහිකෙරෙත්වා—උරශබ්දයාගේ, කෙවල
වක්ෂසෙහිද හෘදයෙහිද වැටෙන්නාවූ අර්ථයෝ ස්වභාවෙන්
ප්‍රකටයි—එය ප්‍රෞඪබාරයක් කොට කීමෙන් කවර ප්‍රයොජ

නද?—නානාවිධ පොත්වල ලිපි වශයෙන් නානාවිධ පාඨ
යෝවෙති—මෙහි කියනලද-"තථා අකත්වා භික්ඛුස්ස ජත්තු
නිපි උරම්පිච"—යනු බොහෝ පොත්වල—"තථා අකත්වා
භික්ඛුස්ස ජන්නුනිපි උරම්පිච"—කියාද-ඇතැම් පොත්වල—
"තථා අකත්වා භික්ඛුස්ස ජන්නුනි උදරම්පිච"—කියාද තිබේ-
නමුත් එයින් අර්ථාවිරුද්ධ ශුද්ධ පාඨයක් වශයෙන් පණ්ඩිතයන්
විසින් පිළිගතයුතුව තිබෙන්නේ—"තථා අකත්වා භික්ඛුස්ස
ජත්තුනිපි උරම්පිච"—යන පාඨයයි—එසේම විනයවිනිශ්චය
ටීකා සම්බන්ධ යම් පොතක—"උරම්පිවාති හදයම්පි "-කියා
ත් තිබියහැක්කේය—එසේ තිබීමෙන් යොග්‍යවූ අර්ථයක් හැ
ගේදැයි පණ්ඩිතයන් විසින් සිතිය යුත්තේයි—දෙසනාර්ථක
ථාදි පාලිපොත්හි බොහෝසෙම 'හදය' ශබ්දයෙන් හෘදය
වස්තුව කියනලද්දේය—විසුද්ධිමාර්ගයෙහි—"හදයං සරීරබ්භ
න්තරෙ උරට්ඨි පඤ්ජරමජ්ඣෙ නිස්සාය ඨිතං"—භාවය—හෘද
ය ශරීරාභ්‍යන්තරයෙහි උරඇට මැදිරිය ඇසුරුකොට පිහිට
යේයි—මෙසේ "හදයං" යන්නෙන් ප්‍රධානාර්ථ වශයෙන් ශරී
රාභ්‍යන්තරයෙහි උරඇටමැදිරිය ඇසුරුකොට සිටි හෘදයව
ස්තුව හැගේ—උපචාරාර්ථවශයෙන් එස්පස හෙවත් ලය හැ
ගේ—පාලිභාෂාවේ ඒ උරශබ්දයෙන් හැගෙන හෘදයාර්ථය
ප්‍රකටයි—එහෙයින් ලීනාර්ථකථනයෙහි ඒ උරශබ්දයේ කිය
යුතු අප්‍රකටවූ හෘදයාර්ථයක් නොපෙණේ—ඒ ශබ්දයේ එක
දෙශොපචාරවශයෙන් කියයුතු ලයේ අංශයක් කියයුතුව
තිබේ—"ජත්තුනි" කීතන්හි ජත්තුශබ්දයෙන් හැගෙන ප්‍රධා
නාර්ථයවූ අංශයසම්බන්ධ අංශකූටය ලීනාර්ථවශයෙන් කිය
යුතුයි—ඉත්නිසා ඊට ලීනාර්ථකීමෙහි "උභොඅංසකූටානි"-
කියා උරහිස්දෙකයයි දක්වනලදී—එය ප්‍රකාශකරණපිණිස
කඞ්ඛාවිතරණීපිටපතෙහි—"ජත්තුංවා"—දසරුවහෝ යි අර්
කියනලදී—මේ සියළුම ආචාර්ය්‍යවරයන්ගේ අර්ථයන් හැරද
මා—ජත්තුනම් ග්‍රීවයට පාත පිහිටි ගලසරඇට කොන්යයි කි
යත්නම් ඒ ධම්මවාදිකථාවක් නොවේමය—ජත්තු ශබ්දයේ
ලීනාර්ථය අංශකූටයයි දක්වූ ආචාර්ය්‍යවරයන් විසින්ම උර
ශබ්දයේ ලීනාර්ථයද එක දෙශොපචාරවශයෙන්—"උරම්පි
වාති අංසම්පි"—කියා එස්පස සම්බන්ධ අංශයයි කියනලදී-
"උරම්පිවාති හදයම්පි"—කියා තිබේය යන ශබ්දය ඇසූ අප
විසින්ද විනයවිනිශ්චයටීකාවසම්බන්ධ නොයෙක් තන්හි ති
බෙන පොත් බැලූනමුත් එයින් එකපොතකවත් උරම්පිච
යන්නට කී ලීනාර්ථයේ හකාරයමුල්වූ පදයක් නොදක්නා

ලද්දේය—ආංශයට නම්වූ ජත්‍රුශබ්දයේ භාවය අංශකූටයයි
අර්ථ දැක්වූසේම වක්ෂසට නම්වූ උරශබ්දයෙන් මේ ශික්ෂාප
දයෙහි කියවුනු භාවය වක්ෂස සම්බන්ධ අංශයයි හඟවන
පිණිස "අංසම්පි" යි ලීනාර්ථය කීබව ශබ්දාකාරගතවම හැඟේ-
ඇතුළුගම යනකල කය විවෘතකොට පොරවා ගිය සවග
මහණුන්-වක්ෂසේ අංශයක්මුත් සකලවක්ෂස විවෘතකොට
නොගිය හෙයින්ද එලෙස පොරවා යනු නොහැකිනෙයින්
ද—ඒ විවෘතකළ අංශය වසන්නට නියමකළබැවින් විනයවි
නිශ්චයටීකාවේ භාවය තත්වූපරිද්දෙන් කියනලද්දේය—
කඞ්ඛාවිතරණීපිටපතෙහි එකදෙශොපචාරවශයෙන් ශබ්ද
ය සොඳ "උරංවා" ලයහෝ-යි පිටපත්කරණ ලද්දේයි—ඒ
කෙලෙසවූනමුත් හදයම්පි යන අර්ථයෙන්වත් ඒකාංශකො
ට පෙරවීම සුප්පටිච්ඡන්නකිරීමයයි ප්‍රකාශකිරීමට පිහිටක් නැ
ත්තේමය—ඒකාංශකොට කොයිලෙසකින් පෙරවූවත් වක්ෂ
ස හෙවත් ලය සම්පූර්ණලෙස නොවැසේ—ලයේ අංශයක්
නොවැසීම තිබේ.

මේ ශික්ෂාපදයෙහි කියනලද දෙකොණ සමකිරීමද සං
හරණයද කෙසේදයත්—සමන්තපාසාදිකාවෙහි මෙසේපෙ
ණේ—"උභොකණ්ණෙ සමං කත්වා පටිසංහරිත්වා යාවමණි
බන්ධා පටිච්ඡාදෙත්වා අන්තරඝරෙ ගන්තබ්බං"—භාවය—
දෙකොණ සමකොට පස්සට ඇකුලා නොහොත් පස්සට
එකතුකොට මැණික්කට්ටුව දක්වා වසාගෙණ ඇතුළු ගම
යායුතුයි—මීට පූර්වූ ඒකාංශ පරිමණ්ඩල පාරුපණ ශික්ෂාපද
වර්ණනාවේදී කියනලද දෙකොණ සමකිරීමට පටිසංහර
ණයක් හෙවත් පස්සට ඇකිළීමක් නොකියනලද්දේය—මෙ
හි පටිසංහරණය කියනලද්දේය—මෙය මෙම අටුවාවේ චීව
රක්ඛන්ධකට්ඨකථාවේද කියනලද්දේය—ඒ මෙසේයි—"සු
ප්පමාණචීවරං පාරුපන්තෙන සංහරිත්වා බාහාය උපරිඨපිතා
උභො අන්තා බහිමුඛා තිට්ඨන්ති"—භාවය—යහපත් ප්‍රමාණ
ඇති සිවුර පොරවන්නනු විසින් හකුළා බාහුමත්තේ තබන
ලද කොන්දෙක පිටතබලා සිටිත්—මෙයි පෙරවීමෙහි සම
කළ කොන්දෙක බාහුව මත්තේ පිටට මුඛ ඇතුව සිටිනබව
කියනලදී—ඒකාංශකොට පෙරවූකළ කොන් දෙක දෙපැත්
තේ වැටිතිබෙණබවත් පැහැදිලිව හැඟේමය—ඒකාංශකො
ට පෙරවීමම සුපටිච්ඡන්නයයි කියන පින්වතුන්ට මෙය මෙ
සේබව පෙණුනු කල මෙය අනිකක්පිණිස කියනලද්දකැයි
ඒ පින්වතුනු කියති—ඛන්ධකට්ඨකථාව පිළිගත්තා හා සමාන

තමන්ගේ ග්‍රාහය නොපිහිටනබැවි හැඟුන හෙයින් ඒ කියනලද්දකි—එය සිවුරුපෙරවීමටම කියනලද්දේයි—භොජනාදියක් පිණිස නොකියනලද්දේයි-නිවාසනපාරුපණය පිණිස සිවුරු කටයුතුවිධිය චීවරකබන්ධකයෙහි වදාරණලද්දේය,-ඒ සිව්රුකිරීම හැඳුම් පෙරවුම් කරන්නට යොග්‍යලෙසම නියම කටණලද්දේය—එසේවදාළ පෙළද ඊට අභිනුත්වගන්සේලා විසින් කර වදාරණලද අට්ඨකථාද පඤ්චසතික සත්තසතික සාහස්සික යන සඞ්ගීතිත්‍රණටම නගණලදී—ඒ සෑමතන්හි චීවරයේ බාහනන්තදෙක සිවුර පොරවා බාහුවමත්තේ තැබූ අනන්තදෙක පිටබලා සිටිනාබැව්ද ඒ දෙකට බාහන්තනාමය කියනබැව්ද ප්‍රකාශ කරණලද්දේය—ඉත්නිසා යම්පින්වත්හු එය සිවුරුපෙරවීමපිණිස නොකියනලද්දකැයි කියද්ද—එය ඔවුන්ගේම වචන මාත්‍රයක් වෙයි—බුද්ධශාසනයේ නොපිහිටාමය.

# සුපටිච්ඡන්නෙනඅන්තරඝරෙගමනකථා

---

## 5

මෙසේ සුපටිච්ඡන්නව ඇතුළුගම යනුපිණිස ශික්ෂාපද පණවා තිබෙන කල්හිද, කය විවෘතකොට ඇතුළුගම හිඳීම වලක්වනපිණිස ශික්ෂාපදයක් නොපණවා තිබුන හෙයින් සවගමහණහු සුපටිච්ඡන්නව ඇතුළුගමට පැමිනද, ඇතුළුගම හිඳිනාකල්හි සුපටිච්ඡන්නනොව කය විවෘතකොට හුන්නාහුය—ඒ නිදානකොට සුපටිච්ඡන්නව ඇතුළුගම හිඳීම පිණිස සෙඛියාවේ පළමුවෙනිවර්ගයේ සිව්වෙනි ශික්ෂාපදය පණවා වදාළසේක—ඒ මෙසේයි-පචිතිපොතෙහි—"තෙන ඛොපනසමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදන්ති"—භාවය—එකල්හි වනාහි සවගමහණහු කය විවෘකොට ඇතුළුගම හිඳිති—මෙහි කී කයවිවෘතකොට හිඳීමනම් සකලශරීරය විවෘතකොට හිඳීමනොව විහාරයෙහි හිඳිනාපරිද්දෙන් ඒකාංශකොට පොරවා හිඳීමයි—එය නිදානකොට පැණවූ ශික්ෂාපදයනම්—"සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛාකරණීයා"—භාවය—මනාකොට සිවුරෙන් කය වසනලද්දේ අතුරුගෙරෙහි හෙවත් ඇතුළුගමෙහි හිඳින්නෙමියි ශික්ෂාතොමෝ කටයුතුනිය—"සුපටි

ච්ඡන්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං යො අනාදරියං පටිච්ච
කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස”-
භාවය—සුපිළිසන්වූවහු විසින් ඇතුළුගම හිඳියයුතුයි—යමෙ
ක් අනදරපිණිස ඇතුළුගම කය විවෘතකොට හිඳිනම් ඔහු
ට දුකුළා ඇවැත්වේ—සුපටිච්ඡන්නව ඇතුළුගම යනවිට කය
වසන පරිදි අටුවාහි සෙඛියාවේ තුන්වෙනි ශික්ෂාපදයට
කරණලද වර්ණනාවෙහි විස්තරකොට තිබුන නමුත් මේ ස
තරවෙනි ශික්ෂාපදවර්ණනාවෙහි නැවතද විස්තරකරණ ලද්
දේය-සුපටිච්ඡන්නව ඇතුළුගම යාමෙහිදි කය වසනසේම ඇ
තුළුගම හිඳිමේදීත් වැසිම කටයුතුනම්-අට්ඨකථාචාර්ය්‍යවරයෝ
නැවත අමුතු විස්තරයක් කුමට කළාහුදයත්-ඒගමනේදී කය
වැසීමට වෙනස්ලෙස වැසීමක් හිඳිමේදී කටයුතු හෙයින්ම
නැවත විස්තරයක් කළෝම්ය—ඒ විස්තරය සමන්තපාසාදි
කාවේ මෙසේ පෙණේ—“ගලවාටකතො පට්ඨාය සීසං මණි
බන්ධතො පට්ඨාය හත්‍ථෙ පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙ
විවරිත්වා නිසීදිතබ්බං”—භාවය—ගලවළපටන් හිසද මැණි
ක්කටුවපටන් හස්තයන්ද පිඩුමස්පටන් පාදයන්ද විවෘත
කොට හිඳියයුතුයි—මෙහි අර්ථයෙන්ම මෙම විවෘත කටයුතු
අවයව පස හැර සෙසුකය වසා හිඳියයුතුය යනු ප්‍රකාශයි-
කඞ්ඛාවිතරණී අටුවාහි—“චතුත්ථෙ ගලවාටකතො පට්ඨා
ය සීසං මණිබන්ධතො පට්ඨාය හත්‍ථෙ පිණ්ඩිකමංසතො ප
ට්ඨාය පාදෙ විවරිත්වා සෙසං ඡාදෙත්වා නිසින්නො සුපටිච්ඡ
න්නො නාම හොති”—භාවය—සතරවෙනි ශික්ෂාපදයෙහි ග
ලවළපටන් හිසද මිණිබහන්පටන් හස්තයන්ද පිඩුමස්පටන්
පාදයන්ද නොවසා තබා සෙසු ශරීරය වසාගණ හුන්නේතේ
සුපටිච්ඡන්නනම් වේ—මේ අටුවාදෙක්හිම එළියේතබන්නට
නියමකළේ ගලවළින් උඩ හිසත් මැණික්කටුවලින් පාත
දෑතත් ගොප්මසින් පාත දෙපයත් යන අවයව පසයි—ග්‍රීවය
වත් අංසකූටයක්වත් බාහුවක්වත් විවෘතකරන්නට නියම
නොකරණලද්දේය—ඒකාංශකොට කෙලෙස වසාඋන්නත්
ග්‍රීවයද-අංසකූටයක්ද-බාහුවක්ද—යන තවත් අවයව තුණ
ක් ඒ සැමකල්හි විවෘතව තිබේ—සමහරවිට අංසයක්ද ත
නයිසක්ද කිසිල්ලක්දැයි තවත් අවයව තුණක් සමග අමුතු
අඩග සයක් විවෘතව තිබේ—එය ඒකාංශකොට හිඳිනාවිට
බලාලාම දතයුතුයි—ඒ අවයවයන් විවෘතකොට සුපටිච්ඡ
න්නකරන්නට කිසිම පොතකපතක කියා නැත්තේය—ඒ
කාංශකොට පෙරවීම සුපටිච්ඡන්නතාවයයි කියන පින්වතුන්

ඡන්ත් එකී අවයවයන් විවෘතකරන්නට නියමකල තැනක් පෙන්විය යුත්තේය—ගලවළින් පාත දෙඅතද මැණික්කට්ටු දක්වාද, දෙපය පිඩුමසින් උඩද, යන ශරීරය වැසූ කල්හි අංශදෙකද ලයද කිසිල්ලද වසනලදැහුම වෙති—ඒ වසනු ලබන අවයවවල නම් නොකියනලදැහුය—විවෘත කටයුතු අවයවවල නම් විශෙෂයෙන්ම කියනලදැහුය.

විනය විනිශ්චයෙනි.

"ගලවාටකතො උඩං සීසඤ්ච මණිබන්ධතො *
ජඞ්ඝපිණ්ඩික මංසම්හා හෙට්ඨා පාදෙ උභොපිච
විවරිත්වාවසෙසඤ්ච ඡාදෙත්වා චෙ නිසීදති
හොති සො සුපටිච්ඡන්නො දොසො වාසූපගස්ස න."

භාවය—ගලවළුවෙන් උඩ හිසද, මණිබන්ධයෙන් හෙවත් මැණික්කට්ටුවෙන් පාත අත්දෙකද, පිඩුමසින් පාත පාද දෙකද, විවෘතකොට නොහොත් නොවසා තබා අවශෙෂ ශරීරය වසාගෙණ ඉඳින් හිඳිද හෙතෙම සුපටිච්ඡන්න වේ—(ඇතුළුගම) වාසයපිණිස එළඹියාහට එසේ සුපටිච්ඡන්න නොකලාට දොෂයක් නොවේ—මෙහි "මණිබන්ධතො හෙට්ඨා උභොහත්ථෙ"යි යොජනාව නියමකරණලද හෙයින් මැණික්කට්ටුවෙන් පාත අත්දෙන විවෘතකරන්නට විශෙෂයෙන් නියමකරණලද්දේය-මණිබන්ධතො යනු ඒක වචන බහුවචන දෙක්හි සමානාවූ නිපාත පදයෙකි-මැණික්කට්ටුදෙකින් පාත අත්දෙකයයි විනයවිනිශ්චයෙහිද කඞ්ඛාවිතරණී අටුවාහිද, එකාකාරයෙන් කියනයනලද්දේය-සමන්තපාසාදිකාවෙහිද ඒ භාවයදක්වා කියනලද්දේය-එසේත්-ඇතම් පින්වත්හු එකඅතක මැණික්කට්ටුවක පටන් අත්දෙක විවෘතකොටයයි අර්ථකියනබැව් දනිමු—එසේත් එක්අතක මැණික්කට්ටුවෙන් පාත අත්දෙකක් මෙලෝකයේ ජීවත්වන කිසිම මනුෂ්‍යයකුගේ නැතිබව ඒ පින්වත්හු දනිත්මයයි හඟිමු-එසෙ පෙරවීමට එක්මැණික්කට්ටුවෙන් පාත අත්දෙක ඇති මිනිස්සු නොලැබියහැකිසී—මෙහි ගලවළුවෙන් උඩ හිස නොවසා ඉන්පාත ග්‍රීවාදිය වසන්නට නියමකරණලද්

---

* විනයවිනිශ්චය ටීකාවෙහි—"මණිබන්ධතොති ඉමිනා හෙට්ඨාති යොජෙතබ්බං"—භා ව ය—මණිබන්ධතො යන මේ පදය සමග හෙට්ඨා යනු යෙදියයුතුයි.

දේය-ඒ කියනලද ගලවළුවනම් කුමක්දයත්—විශුද්ධිමාර්ගයෙ
හි—"උභොසු පස්සෙසු කණ්ණචූලිකාහි පුරතො නලාටන්තෙ
න පච්ඡතො ගලවාටකෙන පරිච්ඡින්න සීසකටාහවෙඨනං
අල්ලචම්මං කෙසානාමොකාසො"—භාවය—දෙපස කන්සිළු
වලින්ද, ඉදිරියෙහි නලල කෙළවරින්ද, පිටිපස ගලවළුවෙ
න්ද, පිරිසිඳිනලද හිස්කබල වෙළාසිටි තෙත්සම කෙසයන්
ට අවකාශයි—මෙයින් ගලවළුවය කීවේ පිටිපස කෙස් අව
සන්වූ තැනටයි—ඒ උකුණුවළුයයි කියත්—ඉන්උඩ හිස නො
වැසී තිබෙන්නට ඒ උකුණුවළු දක්වා වැසෙනසේ සිවුරෙ
න් වසන්නට නියමකරණලද්දේය—පිටිපසින් උකුණුවළුද
ක්වා වැසෙන කල්හි ඇතුළුපසින් නික්මතිබෙන ඇට දක්වා
වැසේ-ඉන්උඩ හිසයි—මෙසේ නිශ්චයඇතිව ග්‍රීවය හාත්
පසින් සිවුරෙන් වසා පොරවන්නට නියමකර තිබියදී-විභා
රයේදීමෙන් ඒකාංශ කොට පෙරවීමම සුප්පටිච්ඡන්නකොට
පෙරවීමයයි හඟවන්නට උත්සාහ වඩන සමහර පින්වත්
හු-ඒ විශුද්ධිමාර්ගයේ කියාතිබෙන පිටිසීගලවාටකය පිළිකුල්
භාවනාවට යෙදෙයි—මේ ශික්ෂාපදයේ කියා තිබෙන්නේ
පුරිමගලවාටකය නම් වෙයි—එය උගුරමුල ගලසරඇට ලඟ
තිබෙන වළක්යයි-පූර්වාචාර්ය වචනයන්ට හාත්පසින්ම විරු
ද්ධව මුධාරුඑබස් කියති—එසේ කී කල්හි එය බුද්ධවචනාර්
ථකථාචාර්ය වචනාදියට විරුද්ධව යාමෙන් බුද්ධශාසනික ධර්ම
යන්ට පටහැනිව සිටී—ඒ මෙයින් දනවුනු—සම්‍යක්සම්බුද්ධය
න්වහන්සේ විසින් භික්ෂූන්ට ගම්වැදගිදිනකල්හි සුප්පටිච්ඡන්න
කරන්නට නියමකරවදාළපරිදි අසා ශ්‍රාවකයන්වහන්සේලා
විසින් ඒ සුප්පටිච්ඡන්නකිරීම ගලවළුවදක්වා ග්‍රීවයත් වසා ඉ
න්උඩ හිස නොවසා විවෘතකොට කරන්නට නියමබැව් අ
ර්ථකථාදියෙන් ප්‍රකාශ කරණලද්දේය—එසේ නියමකළ ක
ඞ්ඛාවිතරණී නම් අටුවාවේ ගම්භීරාර්ථයන් සිංහලභාෂාවට
පිටපත්කරණ ශ්‍රාවකයන්වහන්සේලා විසින්-භික්ෂුප්‍රාතිමො
ක්ෂයේ සෙඛියාවේ පළමුවෙනි වර්ගයේ සතරවෙනි ශික්ෂාපද
යේ අටුවාවේ ගලවළුවෙන් උඩ හිස විවෘතකොට ඉත්පාත
සිවුරෙන් වසන්නට නියමකළ තැන ගලවළුනම් මේයයි
මෙසේ ප්‍රකාසකරණලද්දේය-ගලවළුවනම්—"උකුණුවළුහා
උගුරේ නික්මතිබෙන්නාවූ ඇටද ගලවළු නම් වේ"—මෙ
සේ භික්ෂූන්ගේ සේඛියාවට අයිති පළමුවෙනි වර්ගයේ සතර
වෙනි ශික්ෂාපදයේ සුප්පටිච්ඡන්නතාවට නියමකළ ගලවළු
නම්-"උකුණුවළුහා උගුරේ නික්මතිබෙන ඇටයයි"—බුද්ධ

ශාසනයෙහි ත්‍රිපිටකාර්‍ථ ප්‍රකාශකළ මහොත්තමාචාර්‍ය්‍යයන්
වහන්සේලා විසින් ශරත්කාලයෙහි නභොමධ්‍යගත සූර්‍ය්‍ය
මණ්ඩලයමෙන් දක්වානිබියදම නැත එය පිළිකුල්භාවනා
වට යෙදෙයි—මේ සුප්පටිච්ඡන්නාකිරීමට උගුරමූල වළ ලෙ
දෙසීකියා බුඩශාසනයේ ධර්‍මයන් සැබෑකොට කියනු කැමැ
ති කිසිවෙක් කියාද-නොකියාමැයි—ඉහින්-ගලවළිනම්වූ උ
කුණුවලහා උගුරේ නික්මතිබෙන ඇටද යන මෙයින් නිය
මකොට කිතැතින් උඩ හිසත් මැණික්කට්ටුදෙකින් පාත
අත්දෙකත් ගොප්මස්දෙකින් පාත පාදෙකත් විවෘතකොට
හෙවත් නොවසාතබා අවශෙෂ සියලු ශරීරාවයවයන් වසා
උත්කල උරහිස්ද කිසිලිද තනද ලයද ඉලඇටද බඩද ව
සා උන්නායයි මිනිස්සිහියක් ඇති කාටනම් නොහැගේද-
කාටත් හැගේමය—මෙසේ උභයාංස කිසිලි තන ලය
උරයද වසා පොරවා සුපටිච්ඡන්නකරන්නට තදින් නියම
කර තිබියදී "දෙවුර වහපල්ලා" කියා මෙකි වචන නොකි
තිසා උභයාංසය වැසීම වරදයයි කියන්නෝ දෙතනවසව් කි
වේනැත දෙකිසිලිවසව් කිවේනැත බඩවසව් කිවේනැත එ
බැවින් දෙකිසිලි නොවසමුය දෙතන නොවසමුය නොකිය
ත්ද?-එසේද ඔවුන් විසින් කියයුතුයි-මෙසේ නියමකරණලද
සුපටිච්ඡන්නව ඇතුළුගම හිඳීම නොකොට කය විවෘතකොට
හිඳීමෙහි කවරෙකුට අනාපත්ති වේදයත්—එය පචිතිපොතෙ
හි මෙසේ දක්වනලදී-"අනාපත්ති අසඤ්චිච්ච, අසතියා, අජාන
නතස්ස, ගිලානස්ස, වාසූපගතස්ස, ආපදාසු, උම්මත්තකස්ස,
ආදිකම්මිකස්සාති"—භාවය-නොසිතා, අසතියෙන්, නොදන්
නාහට, ගිලානාහට, වාසූපගතයාට, ආපදාවන්හි, උමතුවූවා
හට, ආදිකර්‍මිකයාටද, අනාපත්තියි—මෙහි වාසූපගතස්ස කි
යාතිබෙන හෙයින් සමන්තපාසාදිකාවෙහි එය මෙසේ ව
ර්‍ණනා කරණලද්—"වාසූගතස්සාතිවාසත්ථාය උපගතස්ස ර
ත්තිභාගෙවා දිවසභාගෙවා කායං විවරිත්වා නිසීදතො අනා
පත්ති"—භාවය—වාසූපගතස්ස යන මෙහි අර්‍ථයනම් වාසය
පිණිස එළඹියාවූ රාත්‍රිභාගයෙහි හෝ දිවසභාගයෙහිහෝ
කය විවෘතකොට ඉන්නාහට අනාපත්ති හෙවත් දොෂයක්
නැත්තේයි—මීට විමතිවිනොදනී ටීකාවේ මෙසේ අදහස
හගවා තිබේ—"විවරිත්වා නිසීදතොති විහාරෙවිය ඒකංස
පාරුපණං සන්ධාය වුත්තං"—භාවය-(කය) විවෘතකොට හිඳි
නාහටය යනු විහාරයෙහිමෙන් ඒකාංශපාරුපණය සඳහා
කියනලදී-ගමේ වාසය පිණිස පැමිණිකල එහි ආවාසගෙණ

වසන භික්ෂුතෙම විහාරේදීමෙන් ඒකාංශකොට පොරවා උන්නාට වරදක්නොවේ—භික්ෂාග්‍රහණ පරිත්‍රාණකරණ ධර්ම දේශනාදිය කොට එනපිණිස පැමිණ එසේ ඒකාංශකොට පොරවාගෙණ හිඳිනම් වරදය යන අභිප්‍රායී—ගමේ වාසය පිණිස ගිය අය ඒකාංශකොට පොරවා හිඳිනම් දොෂනැත එසේ නොවේනම් දොෂයයිද වෙන කටයුත්තකට යනකාල සුපටිච්ඡන්නාවම යායුතුයයි කී කල්හිද, කාය විවෘතකොට හිඳිමනම් ඒකාංශකොට පෙරවීමයයි කී කල්හිද, ඒකාංශකොට පෙරවීම විහාරේදී පොරවණ පෙරවීම සමානයයි කීකල්හිද, ගමේ යාමට නියමකළ සුපටිච්ඡන්නා පාරුපණයත් ගමේ වැලඳීම්ආදියට ගොස් හිඳිනාකල සුපටිච්ඡන්නාව හිඳීමට නියමකළ පාරුණයත් ඒකාංශ පෙරවීමයයි මිනිස් සිහියක් ඇති කාටනම් වැටහේද, නොවැටහේමය—සිහිත් සිතා එසේ කියහැකි යමෙක් මිනිසුන්අතරේ ඇතැයි නො සිතමිහ -ගමේ වාසයපිණිස ගොස් හිඳීමගැණ තවත් සවල්පයක්දුර ටීකාවාක්‍ය පරීක්ෂාකොට බලමු—විනයවිනිශ්චයෙහි—"දොසොවාසූපගස්සන"—වාසය පිණිස එළඹියාහට දොෂයක් නොවෙයි—යන මිට-ටීකායෙහි මෙසේ කියනලද්දේය—"වාසූපගස්සානි එකංකායං විවරිත්වා නිසීදතොනි සෙසො"—වාසූපගතයාටය යන මෙහි කාය විවෘතකොට හිඳිනාවූ යනු ශෙෂවූ පාඨයි—ඒ කාය විවෘතකොට හිඳීමනම් විහාරේදී මෙන් ඒකාංශකොට පෙරවීමයයි විමතිවිනොදනියෙහි කියන ලද්දේය—එහෙයින්-සවගමහණුන් අතුළුගම කාය විවෘතකොට හුන්නාහුයයි කියනලද්දේ විහාරයේදීමෙන් ඒකාංශකොට පොරවා උන්නාහුය යනුයි—ඇතුළුගම කාය විවෘතකොට ගියාහුය කීවේ-විහාරයෙහිදී මෙන් ඒකාංශකොට පොරවා ගියාහුය යනුයි—ඒකාංශකොට පෙරවූ කල්හි සවභාවයෙන් උරහිසක්ද ළයේ අංශයක්ද විවෘතව හෙවත් නොවසනලදුව තිබේ-එහෙයින්ම ජත්‍රුවද ළයදැයි කියාද, අංශකූටයන්ද අංශයයිද කියාද නානානයින් අටුවා ටීකාවල කියනලදී—එසේ ඒකාංශකොට පොරවා ජත්‍රුවද ළයේ අංශයක්ද විවෘතකොට කැමති පරිදෙන් ඇතුළුගම කොතැනට යා යුතුදැයි තවත්දුර ටීකාවාක්‍යයෙන් සෙවිය යුතුයි—ටීකාහි—"වාසූපගතො නාම රත්තිවාසත්ථාය උපගතො-ඒතෙනෙව වාසත්ථාය අන්තරඝරං උපගච්ඡන්තෙන සුපටිච්ඡන්නෙනෙව උපගන්තබ්බන්ති දීපිතං හොති—එතෙනෙව වාසූපගතස්ස සන්තිකං උපගතස්ස යථාකාමගමනෙ න දොසොති

වුත්තමෙව හොති-තෙනාහගණ්ඨිකපදෙ—එකදිවසම්පි වාසු
පගතස්ස සන්තිකං යථාසුඛං ගන්තුං වට්ටති කොපනවාදෙ
චතුහපඤ්චාහංවසිතභික්ඛූනං සන්තිකංගන්ති''-භාවය-වාසුපගත
යානම් රාත්‍රියේ විසීමට එලඹඋන්නේය-මෙසින්ම වාසයපිණී
ස එලඹෙන්නා විසින් (පැමිණෙන කාලයෙහි) සුපටිවජ්ජනන
වම එලඹිය යුතුයයි දක්වනලද්දේ වේ—මෙසින්ම වාසය
පිණිස එලඹියාගේ සමීපයට පැමිනියනු විසින් කැමති පරිද්
දෙකින් යාමෙහි දොස් නොවෙයි කියනලද්දේම වේ-එහෙයි
න් ගණ්ඨිපදයෙහි—එකදිනක් නමුත් වාසයපිණිස ඇතුළු
ගමට පැමිණියාහුගේ සමීපයට සැපවූ පරිද්දෙන් යා යුතුයි-
සතර පස්දිනක් විසූ භික්ෂූන්සමීපයට යන්නාහට කියනුම
කවරේදැයි කීහ—මෙසේ නානාවිධ ක්‍රමයෙන් වාසුපගතයා
හට විහාරේදීමෙන් ඒකාංශකොට පෙරවීමෙන් දොස් නැති
බව ා ප ඒකාංශකොට පෙරවීම යය විවෘතකිරීම බවත්—එ
සේ වාසුපගත භික්ෂූන් ඉන්නාතැනට යාම විහාරයට යන්නා
සමාන බැවින් ඒතැනට යාමේදී සුපටිවජ්ජන්න නොකොට
යාමේ දොස් නැතිබවත් දක්වා තිබෙද්දීද—සුපටිවජ්ජන්න
කොට යන්නට කියනලද්දේද සුපටිවජ්ජන්නව හිඳීම නියමක
ළේද ඒකාංශකොට පොරවා හිඳීමපිණිසයයි මේ ධම්මය යන
කල්පනාවෙන් කිසිවෙක් විසින් කියහැකියයි නොසිතමු—
මෙසේ තිබෙන විස්තර දැකදැකත් තමන් විතකලක් කළ
පරිදිම නිවරදියයි කියා ධම්මය අධම්මය කොට විනය අවිනය
කොට ලීම සුදුසුවේදැයි ඒ පින්වතුන් විසින් ඊර්ෂ්‍යා මානාදී
යෙන් තොරව සිතියයුතුයි—තවද සමහර පින්වත්හු-සුපටි
වජ්ජන්නකරන්නට නියමකළ තන්හි උභයාංසය වසන්නට
කියානැත ඉන්නිසා සුපිටවජ්ජන්නකිරීමෙහි උභයාංසය වැ
සීමක් නැතැයිකියති—උභයාංසය වැසීම පමණක් සුපටිවජ්ජන්
න කිරීමක් නොවේ—උභයාංසය වසා පොරවන්නට කීවො
ත්-ග්‍රීවය නොවසාම උභයාංසය වැසෙනසේ සිවුර උභයාං
සයේලා ගතහැකිවේ—එසේම උභයාංසයවසා කිසිලිද ලය
මැදද උරයද නොවසා පෙරවිය හැකිවේ—එහෙයින් ගල
වළුවෙන් උඩ හිසද දෙමැණික්කට්වූවෙන් පාත අත්දෙකද
ගොප්මස් දෙකින් පාත දෙපයද එළියේ තිබෙන්නට හැර
ඉත් අවශෙෂවූ සියලු ශරීරය වසා ඉන්නට නියමකරණලද්
දේය—එසේකියා නැවත දෙඅංසය වසන්නට කීවහොත් ඒ
අට්ඨකථා පාඨයක් හෝ ටීකා පාඨයක් හෝ නොව උන්මත්ත
ක වාක්‍යයක් සමාන වේමය—එසේනම්-කිසිලිදෙක වසන්

නවද දෙතන වසන්නාද ඉලඇට වසන්නවද නැවැත නැවැ
තකීයයුතු වේද-නොවේමය-එකියනලද පරිද්දෙන් සුපරිවජ
ත්නකොට පෙරවූකල එකී සියලු අවයවම වසා පොරවන
ලද්දේමය—එකාංශකොට පෙරවූකල්හි අංශකූටයක්ද අංස
යක්ද නොවැසී තිබෙනබැවින් ඒ අවයවයන් විවෘතකරන්නා
හට ඇවැත් දක්වනලදී—එසේම වාසයපිණිස පැමින එකාං
ශකොට පොරවා කය විවෘතකොට ඇතුළුගම ගිඳිනාහට
දොස් නැතිබවත් වාසයපිණිස නොව ගොස් ඊංමට ඇතුළු
ගමට පැමිණ එසේ එකාංශකොට පොරවා හිඳිනාහට දොස්
වනබවද දක්වනලදී—මෙකී සියලුමනාය පිත්වත් සත්පුරුෂ
යන් විසින් ඊර්ෂ්‍යාමානාදියෙන් තුරන්ව සලකා සිතට වැට
හෙනසේම කටිනුත් කියනුලැබේවා—විවෘතකරන්නට නිය
මකළ අවගපස හැර අනිකුත් සියලු ශරීරය වසාහිඳිනට යි
කල්හි ඒ පාඨයෙහි අංසදෙක වසන්නට නොකියනලද්දේ
ය ඉන්නිසා සුපටිච්ඡන්නවෙනසේ පෙරවූකල උභයාංසය
නොවැසෙසී යන අධම්මවාදය පෙර කරණලද අධම්මවාදය
කට එක්පරිද්දෙකින් සමානවේ—ඒ මෙයින් දතයුතු-

ප්‍රපඤ්චසූදනීඅටුවාවේ මෙය පෙණේ—"කෙචිනිරොධසමා
පන්නස්ස චිත්තසඞ්ඛාරාව නිරුද්ධාති වචනතො චිත්තං අනිරු
ද්ධං හොති තස්මා සචිත්තකා අයං සමාපත්තීති වදන්ති—තෙ
වත්තබ්බා-වචීසඞ්ඛාරාපියස්ස නිරුද්ධාති වචනතො වාචා අනිරු
ද්ධා හොති, තස්මා නිරොධසමාපන්නෙන ධම්මම්පි කථෙන්
තෙන සජ්ඣායම්පි කරොන්තෙන නිසීදිතබ්බංසියා, යොචා
යං කාලකතො තස්සාපි චිත්තසඞ්ඛාරාව නිරුද්ධාති වචනතො
චිත්තං අනිරුද්ධං භවෙය්‍ය, තස්මා කාලකතෙ මාතාපිතරෙ
වා අරහන්තෙවා ඣාපෙන්තෙන අනන්තරියකම්මං කතං
භවෙය්‍ය—ඉති බ්‍යඤ්ජනෙ අභිනිවෙසං අකත්වා ආචරියානං
නයෙ ඨත්වා අත්ථො උපපරික්ඛිතබ්බො, අත්ථොහි පටිසරණං
න බ්‍යඤ්ජනං"—මෙහි භාවය—සමහර පුද්ගලයෝ නිරොධ
සමාපත්තියට සමවන්නාහුගේ චිත්තසංස්කාරයෝ නිරුද්ධම
යයි කී හෙයින් සිත නිරුද්ධනොවෙයි—එහෙයින් මේ සමා
පත්තිය හෙවත් නිරොධසමාපත්තිය සිත්සහිතයයි කියති-
ඔව්හු මෙසේ කියයුතුවෙති—ඔවුන්ගේ වාක්සංස්කාරයෝද
නිරුද්ධයයි කී හෙයින් වචනය අනිරුද්ධවෙයි—එහෙයින් නි
රොධයට සමවැදුනහු විසින් ධර්මයද කියමින් සජ්ඣායනාද
කරමින් හිඳියයුතුවන්නේය-කාලක්‍රියාකළාවූ යම් මේ පුද්ගල

යෙකුත් වේද ඔහුගේද චිත්තසංස්කාරයෝ නිරුද්ධ වේයයි
කීහෙයින් සිත අනිරුද්ධවිය යුතුයි—එහෙයින් කාලක්‍රියා ක
ළාවූ මවුපියන් හෝ රහතුන් හෝ දවන්නාහු විසින් ආනන්ත
රිය කර්මය කරණලද්දේ විය යුතුය—මෙසේ ව්‍යංජනයෙහි
ඇතුළත්වීම නොකොට ආචාර්‍ය්‍යයන්ගේ ක්‍රමයෙහි සිට අර්ථ
ය පරීක්ෂා කටයුත්තේය—අර්ථයම පිළිසරණවේ-ව්‍යංජනය පි
හිට නොවේ—මේ වාදයෙහි අධර්මවාදීන්ගේ මතයනම්-නි
රොධසමාපත්තියට සමවැදුනාහුගේ චිත්තසංස්කාරයෝ නිරු
ද්ධයයි කීනුමුත් චිත්තය නිරුද්ධයයි එවචන ඒ පාඨයෙහි කියා
නැත—ඉතිනිසා නිරොධසමාපත්තිය සිත්සහිතමය යනුයි—
යමෙකුගේ චිත්තසංස්කාරයෝ නිරුද්ධනම්-චිත්තය ඒ සමග
ම නිරුද්ධබව අභිධර්මයෙන්ද සූත්‍රධර්මවල අර්ථයෙන්ද ප්‍රකා
ශයි—නුමුත් ඒ පාඨයේ වෙන්කොට සිතද නිරුද්ධයයි නොකී
නිසා සිත නිරුද්ධනොවෙයි—අධර්මවාදීන්ගේ මතයයි-ඊටවි
රුද්ධ සත්‍යවූ කරුණු නම්—එමනිරොධයට සමවැදුනාහුගේ
වාක්සංස්කාරයෝ නිරුද්ධය කියනලද්දේවීනමුත් වචනය නි
රුද්ධය යන වචන එහි කියානැත, ඉත්නිසා නිරොධයට සම
වැදුන රහතුන්වහන්සේ ධර්මය කියමින් හඳුරමින් ඉන්නෙ
ක්ද වියයුතුය—තවද කාලක්‍රියාකළ අයගේ චිත්තසංස්කාර
යෝ නිරුද්ධයයි කීනමුත් සිත නිරුද්ධය යනවචන ඒපාඨයේ
කියා නැත්තේය—ඉත්නිසා කාලක්‍රියාකළ අයගේද සිත නි
රුද්ධනොව තිබිය යුතුය—සිත නිරුද්ධනැත්නම් සචිත්තක
වෙයි—ඒ එසේනම් කාලක්‍රියාකළ මව්පියත් රහතුන් ආදහ
නකෘත්‍යයවශයෙන් දවනඅය විසින්ද මාතෘඝාතකාදී ආන
න්තරිය කර්ම කළා වියයුතුයයි කියා ධර්මවාදීන් විසින් අකු
රේම ඇතුලත්නොවී අර්ථය පරීක්ෂාකරන්නට කියා එය සං
සිඳුවනලද්දේය—මේවාදය එපමණත් දරුසිටින්නට කරුණු
නැතිමය—ගලවළුවෙන් උඩ හිසද මණිබන්ධයෙන් පාත දෑ
තද ගොප්මසින් පාත දෙපයද නොවසා අනිකුත් සියළුම
ශරීරාවයත් වසා පොරවා හිඳිනට නියමකළ නුමුත් එසේ
කියා දෙඅංසය වසන්නට කියානැත ඉන්නිසා ඒ සුපටිච්ඡ
න්නවීමට උභයාංශය වසන්නට යුතුනොවෙයි—එකඅංශය
ක් විවෘත කටයුතුයයි කීකල්හි—ඒ එසේනම් නැබමඬලත්
දනමඬලත් වසා හඳනය අඳින්නට නියමකරණලද්දේ න
මුත් එහි ආනිසදෘදිය වසන්නට කියා නැත්තේය—ඉන්නිසා
ආනිසදෘදිය නොවසාම පිටිපස විවෘතකොට තෙමඬුලුවසා

හැඳිය යුතුය එලෙස සිවුරුකඩක් හැඳීමද තෙමඩුලුවසා හැඳි
මච්ච යුතුයයි කීකලද, දෙතන දෙකිසිලි වැසිමක් සුපටිච්ඡන්
නකිරීමට කියා නැතිහෙයින් ඒදෙතන යනාදිය නොවසා
පෙරවීමද එසේ කියන්නන්ට සුපටිච්ඡන්නකිරීම විය යුතුය
යි-කීකලද අතිරෙඛ වාදය පසුබැස්සාසේ පසුබසියි—එසේ
නමුත් මේගැණ ටීකාහි කය විවෘතකිරීමනම් ඒකාංශකොට
පෙරවීමය කියාද අංශකූටාදිය නොවසා ඇතුළුගම යාමද
හිඳීමද ආපත්තිකරයයි කියාද තිබෙනබැවින් විතතාතිරෙඛ
වාදය පමණත් නොනසීමය—

"සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛාකරණීයා',
යන—සෙඛියාවේ තුන්වෙනි ශික්ෂාපදයෙන් සුපටිච්ඡන්නව
ඇතුළුටම යාම නියමකරණලද්දේය, ඊට අනතුරුවූ සතර
වෙනි ශික්ෂාපදයෙන් සුපටිච්ඡන්නව ඇතුළුගම හිඳීම නිය
මකරණලද්දේය—මේ දෙක්හි එකිනෙකට විශෙෂයක් ඇද්
දයත්—ඒ දෙක්හි බොහෝසේම විශෙෂ තිබෙනබැවින් අට්ඨ
කථා ටීකාවලද ප්‍රකරණවලද දෙයාකාරයෙන් වර්ණනාද වි
නිශ්චයද කරණලද්දේය—අන්තරඝර ගමනයෙහි—"ගණ්ඨි
කං පටි මුඤ්චිත්වා අනුවාතනෙනන ගීවං පිටිච්ඡාදෙත්වා උභො
කණ්ණෙ සමංකත්වා පටිසංහරිත්වා යාව මණිබන්ධං පටි
ච්ඡාදෙත්වා"—යනාදීන් ගණ්ඨියඅමුනා නූවා කෙළවරින් බෙ
ල්ලවසා දෙකොණ සමකොට පස්සට අකුළාගෙණ මණි
ක්කට්වූව දක්වා වසාගෙණ යායුතුබව කියනලදී—එසේ
පොරවා යනකල්හි එක්අතක මණිබන්ධයෙන් පාත එළි
යේතිබෙන නමුත් අනික්අත චීවරගණිය ඇතුළෙහ්ම හෙයි
න් එතැනදී මණිබන්ධයෙන් පාත අත්දෙකම එළියේ ති
බෙනබව නොකියන ලද්දේය—පාත්‍රය අතින් ගත් නමුත්
නොගත් නමුත් දකුණුඅත චීවරයෙන් වැසීතිබේ—ඉත්ති
සාම එබද්දුතන්හි දක්ෂිණහස්තය චීවරගණියෙන් බැහැරකළ
බව කථාවස්තුවල ඇත්තේමය—හිඳීමේදී විවෘතකරණු ලබ
න අවයවයන් ක්යනාතත්හි "ගලවාටකතොපට්ඨාය සීසං"
යනාදීන් අවයව පසක් එළියේතබන ඉම් කියනලදී—භික්ෂා
ව පිළිගැණීමආදි කටයුතු පිණිස අත් නික්මවා හිඳිනා
කල්හි, මණිබන්ධයෙන් පාත අත්දෙක එළියේ තිබෙන
බැව් කියනලදී—අනිකුත් සියල්ලෙන්ම ඒ වැසුම්දෙක සම
සමයි,

තවද, පොරවණ සිවුරේ අවයව—කුසි, අඩ්ඪකුසි, මණ්ඩල,

අඩ්ඪමණ්ඩල, විවට්ට, අනුවිවට්ට, ගීවෙය්‍යක, ජඞෙඝය්‍ය
ක, බාහන්තයයි චීවරඛණ්ඩකයෙහි වෙන්වෙන්වසයෙන්
දක්වා වදාරණලද්දෑහුය—එයින් ගීවෙය්‍යකනම්වූ අවයවය
ග්‍රීවයේ පිටිපසින් උකුණුවලද ඇතුළුපසින් නික්මනිබෙන
ඇටද ඇති ගලවළුව වසා ග්‍රීවය සිරුනුවාවෙන් වෙළා පො
රවතොත් ඇතිවිය යුතුයි—එසේ නොකොට වම්උරහිසපිට
සිවුරදමා දකුණුඅතේ කිසිල්ල යටින්ගෙණ ලැපැත්ත සර
සින් ගත් චීවරභාගය නැවැත වම්උරහිසපිට දමා පෙරවූ
කල ග්‍රීවය වෙළීමක් නැතිහෙයින් ගීවෙය්‍යකනම්වූ අවය
වයක්ද නොකියයුතුයි—ඊට කරුණුනම්—සමන්තපාසාදිකා
වේ-ගීවෙය්‍යක ජඞෙඝය්‍යකයන් දක්වනපිණිස මෙසේ වණ්
නාකරණලදී—ගීවෙය්‍යකන්ති ගීවාවෙඨනට්ඨානෙ දළ්හීකර
ණත්ථං අක්ඛසුත්තසංසිබ්බිතං අගන්තුගපත්තං, ජඞෙඝය්‍ය
කන්ති ජඞ්ඝාපාපුනනට්ඨානෙ තථෙව සංසිබ්බිතං පත්තං,
ගීවට්ඨානෙ ජඞ්ඝට්ඨානෙච පත්තානමෙතං නාමන්තිපි වද
න්ති—මෙහි භාවය—සිවුරේ ග්‍රීවය වෙළෙන්නතන්හි දෑඩිකිරීම
පිණිස අනිකුත් හුයින් මහනලද්දෑවූ අමුතුවූ පතකි හෙවත්
පටකි, ජඞෙඝය්‍යකනම් කෙණ්ඩයගට පැමිණෙන තැන එ
සේම මහනලද පත්‍රයකි හෙවත් පටකි * ග්‍රීවය (වෙළන)
තන්හිද, කෙණ්ඩයට පැමිණෙන තන්හිද (ප්‍රකෘතියෙන් වූ)
පත්‍රයන්ට මේනාමැයිද්ද කියත්—†

එකාංශකොට පෙරවූකල්හි සිවුරෙන් ග්‍රීවය නොවෙළෙ
නබව සියල්ලන්ටම පෙණේ—ග්‍රීවයවෙළා පෙරවීමෙන් ග්‍රී
වය වෙළෙණතැන සිවුරු නුවාව ටිකකලකින් දුර්වලව ඉරෙ
නහෙයින් ඊට නවපටක්දමා මහනබව අටුවාවේ ප්‍රකාශක
රණලද්දේය—එකාංශකොට සිවුර තදකොට වෙළුතොත්
වෙළෙන්නේ ග්‍රීවයනොවේ. වම් උරහිසද දකුණු කිසිල්ල
සහිත ඇලයද ලයේ අඩියක්ද වෙළෙයි—එය පොරවනඅය
ටද එය බලන අයටද සැකනැති ලෙසම පෙණේ—එසේ
නොව එකාංශකොට පෙරවූකල ග්‍රීවය වෙළෙයි යමෙක්

---

* මේදේ දැන් කරණු නොලැබෙයි විමතිවිනොදනීනාම්
ටීකාවෙහි පෙණේ, ඒටීකාවකළ කාලේ නොකළබව
එයින් හඟවනලදී.

† විමතිවිනොදනී ටීකාව කරණකාලේද—ගීවෙය්‍යකනම්
ග්‍රීවගට පැමිණෙනතැන පටයි-ජඞෙඝය්‍යකනම් කෙණ්
ඩගට පැමිණෙන තැන පටයි.

කියානම් ඒ මුසාවාදයක්බව බලන සියල්ලන්ටම ප්‍රත්‍යක්‍ෂව
වැටහේමය—ඒකාංශකොට පෙරවීම පිණිස වම්උරහිස පිටි
න් සිවුර ගත්කල්හි කුමකින් ග්‍රීවය වෙළේද?—එසේකල්හි
ග්‍රීවය වෙළන්නටනම් අමුතු පටියකින් වෙළාගතයුතුවේ—
සියල්ලන්ටම මුසාවාදයබැව් හැගෙන කිමක් බුඩශාසනික
චාරිත්‍රයක් සඳහා නොකියයුතුබැව් ඒ පින්වත්හු විවෙකව
සිතත්වා—සිතින්සිතා එසේ කිය නොහැකිබව අපි ඒකාන්ත
කොටම සිතම්හ—“ගීවමෙව අනුවාතනෙතන ඡාදෙතබ්බා”—
යන ටීකාපාඨයෙන් ග්‍රීවය නුවාකෙළවරින් වසාම—කියා ඒ
කාන්තකොටම ග්‍රීවය වසා සුපටිච්ඡන්නකරන්නට නියමක
ළහෙයින් ග්‍රීවයේ පිටිපස උකුණුවලෙනුත් ඇනුඑපස නි
ක්මතිබෙන ඇටෙනුත් පාත ඝුවල්පයක්වත් නොවසා තැබූ
කල්හි සුපටිච්ඡන්නනොවේ—ඒකාංශකොට පෙරවීම සුපටි
ච්ඡන්නකිරීමයයි යමෙක් කියානම් ඒකාංශකොට පෙරවූක
ල්හි නොවැසීම එලියේතිබෙන ග්‍රීවයද—අංසකූටයද බාහුව
ද ලයෙහි අංසයද ච්ඡාතකරන්නට නියමකළ තැනක් ඔහු
විසින් දක්විය යුතුමයි—ඒ නොදක්වනතෙක්ම ඔහුගේ කිම
මුසාවාදයබැව් නුවනැතෙතා සිතත්මය.

## සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ
## නිසිදන කථා.

---

## 6

සව්වඥයන්වහන්සේ විසින් භික්‍ෂූන්ට කායබන්ධනයක් නි
යමකරණලද්දේය—ඒ කුමක්පිණිස නියමකරණලද්දේද?—
චූලවග්ගයෙහි මෙසේ පෙණේ—“තෙනඛොපන සමයෙන
අඤ්ඤතරො භික්ඛු අකායබන්ධනො ගාමං පිණ්ඩාය පාවිසි
තස්ස රථියාය අන්තරවාසකො භස්සිත්ථ”—මෙහි භාවය-එ
කල්හි වනාහි එක්තරා මහණෙක්තෙම කායබන්ධනයක්
නැතිව ගමට පිඩුපිණිස ප්‍රවිෂ්ටවූයේය, ඔහුගේ අඳනය, වී
ථියෙහි වැටුනේය—එකල්හි මනුෂ්‍යයෝ පරිහාස වසයෙ
න් කෝලාහල කළහ. ඒ භික්‍ෂූහු විහාරයටගොස් භික්‍ෂූන්ට
මෙපවත් කියා භික්‍ෂූන්විසින් සව්ඥයන්වහන්සේට සැලකළ
කල්හි—“න භික්ඛවෙ අකායබන්ධනෙන ගාමො පවිසිත

බ්බො යො පවිසෙය්‍ය ආපත්තිදුක්කටස්ස, අනුජානාමි භික්ඛ
වෙ කායබන්ධනන්ති''--මහණෙනි කායබන්ධනය නැත්ත
හු විසින් ගම් නොවැදිය යුතුය—යමෙක් කායබන්ධනය නැ
තිව ගම් වදීනම් ඔහුට දුකුලාඇවැත්වේ මහණෙනි කාය
බන්ධනයක් අනුදනිමියි වදාළසේක—මෙසේ කායබන්ධන
යක් නැතුව ගමට පැමිනිකල අදනය වැටෙනහෙයින් ඒ
අදනය නොවැටෙන පිණිස බැඳීමට කායබන්ධනයක් අනු
දැනවදාරණලද්දේය—පොරවණයක් හෝ සඟලසිවුරක් නො
වැටෙනපිණිස කායබන්ධනයක් නොමඅනුදන්නාලද්දේය-
මෙසේ ගම්වදනා කල්හි භික්ෂූන් විසන් කායබන්ධනයක් බැ
ඳගන්නට ඕනෑබව නියමකොට ඒ පිණිස කායබන්ධනය
ක් අනුදැනවදාළහෙයින් කායබන්ධනයද භික්ෂූන්විසින් පරි
භොගකටයුතු පරිෂ්කාරයකි, එය කුමක්පිණිස කෙලෙස ප
රිභොග කටයුත්තේද—එය බුදුන්වදාළ පරිදි චූලවග්ගාදියෙ
හිපෙණෙන නයින්—අදනය ලිහීවැටීම වලක්වනපිණිස අ
දනය මතෙනහි බැඳියයුතුයි—එය—පට්ටිකාය සූකරන්තකයයි
දෙයාකාරයකින් අනුදැන වදාරණලද්දේය—එයින් පට්ටිකා
නම් කායබන්ධනය හෝ සූකරන්තනම් කායබන්ධනය හෝ
අදනයහැද ඒ මත්තෙහි බැඳිය යුතුයි—මෙසේහෙයින් ග
ම්වදනා භික්ෂුහට හැඳියයුතු බැඳියයුතු පෙරවියයුතු සිවුරු
වසයෙන් සිවුරු සතරක් අවශ්‍යයෙන්ම ප්‍රයොජනවත්වේ-
එනම් අදනය, කායබන්ධනය, උත්තරාසඞ්ගය, සඞ්ඝාටිය,
යනමේයි—ගම්වදනා කල්හි භික්ෂූනු විසින් මෙකීසිවුරු දැරි
යයුතු ක්‍රමය—බුදුන්වදාළපරිදි වත්තක්ඛන්ධකයෙහි මෙසේ
පෙණේ—සචෙආරාමෙකාලො ආරොචිතොහොති තිමණ්ඩ
ලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබ
න්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ග
ණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අත
රමානෙන ගාමො පවිසිතබ්බො—භාවය--ඉදින් ආරාමයෙ
හි කල් දන්වනලද්දේවේද, තෙමඬුළුවසන්නාහු විසින් හාත්
පසින් මණ්ඩලයක් ඇතිකොට (නෙවත් කොන් නොඑල්ලා)
හදනය හැඳ, කායබන්ධනය බැඳ, පොරවණය හා සඟලසි
වුරය යන සංඝාටි එකටඅල්ලා පොරවා ගණ්ඨිය පාසයෙහි
ලා අමුනා සෝදා ප්‍රාත්‍රයගෙණ මනාකොට යුහුසුළුනොවත්
න්නුවිසින් ගම්වැදිය යුතුයි—"මහාවග්ග" යෙහිද—''සචෙ
උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති—තිමණ්ඩලං පටිච්ඡ

දෙනෙතන පරිමණ්ඩලං නිවාසෙතබ්බා කායබන්ධනං බන්ධිතබ්බා සගුණංකත්වා සඞ්ඝාටියො පාරුපිතබ්බා"—යනාදීන් එම ක්‍රමය පෙණේ—මෙසේ ත්‍රිවිධ සඞ්ඝායනාවට නඟණලද දෙසනාර්ථ කථාදියෙහි ප්‍රකාශකළ කළ තන්හි ප්‍රථමකොට හඳනය හැඳීමද, ඊමතෙනහි කායබන්ධනයයි කියනලද පටිය බැඳීමද, ඉන්පසු උත්තරාසඞ්ගය හා සඞ්ඝාටිය පොරවා ගණ්ඨිය පාසයෙහි අමුනා මනාකොට කායවසනපරිදිද ප්‍රකාශකරණලද්දේය—එයින් කිසිතැනෙක්හි—අඳනයහැඳ සිවුරු පොරවා ඒ මතෙනහි කායබන්ධනයක් හෙවත් පටියක් බැඳීම නියම නොකරණලද්දේය—පෙරවූ සිවුරමතෙනහි පටිය බැඳීමක් කිසිම අර්ථකථාචාර්ය කෙනෙකුන් විසින් හෝ ටීකාචාර්යකෙනෙකුන් විසින් හෝ නියම නොකරණ ලද්දේමය—කායබන්ධනය නොබැඳ ගම්වදනා අයගේ අඳන ලිහී වැටෙනහෙයින්—විහාරයෙහිදී හඳනය මතෙහි පටිය නොබැඳ උන් කෙනෙක් එය සිහිනොකොට. සිවුරුපොරවා ගම්වදනට ගියත් සිහිකළතැනක පටන් ගම්වැදීමට නොගොස් කායබන්ධනය සොයා බැඳගණම යාම සුතුබැව් අටුවාහි කියන ලද්දේ මය—සමන්තපාසාදිකාවෙහි—"නභික්ඛවෙ අකායබන්ධනෙනාහි එක් අබන්ධිත්වා නික්ඛනෙතන යත් සරති තත් බන්ධිතබ්බං ආසනසාලාය බන්ධිස්සාමීතිපි ගන්තුං වට්ටති, සරිත්වා යාවන බන්ධති න තාව පිණ්ඩාය චරිතබ්බං"—නාවය-නභික්ඛවෙ අකායබන්ධනෙන යන මේ දෙසනාවේ ක්‍රමයෙන් කායබන්ධනය නොබැඳ නික්මුන භික්ෂූහු විසින් යම්තැනකදී සිහිකෙරේද එහිදී බැඳිය යුතුයි—අසුන්හලදී බඳිමි සිතා යායුතුද වෙයි—සිහිකොට යම්තාක් කල් නොබඳිද ඒතාක්කල් පිඩුපිණිස නොයායුතුයි—මෙසේ පටිය නොබැන්දබව සිහිනොකොට ගොස් සිහිවූකල්හි නැවැත පටිය බැඳගතයුතු කොතනද?—වෙනතැනක නොවේ, නිදානයෙහි පෙණෙන පරිදෙන් අඳනය ලිහිවැටීම වලක්වනපිණිස ඉතේ අඳනය මතුපිට බැන්දයුතුයි—තවද "නභික්ඛවෙ අකායබන්ධනෙන ගාමො පවිසිතබ්බො"—මහණෙනි කායබන්ධනයක් නැත්තනු විසින් ගම් නොවැදිය යුත්තේය යනාදීන් වදාළහෙයින්—එම බ්‍යඤ්ජනච්ඡායාවෙන් අර්ථ ප්‍රතිබාහණය කොට—කහබහන් නොබැඳ ගමටයාම වලක්වා වදාරණලද්දේ වීනමුත් විහාරයෙහි කිසිතැනකට යන්නෙකුවිසින් කාබහන් බැඳ යායුතුයයි නොවදාරණ ලද්දේ

ය කියා විහාරයතුළ ගිහියන් පිස කා වසනතැන් ආදියට ය
න්නන් විසින් කාබහන් නොබැඳ යායුතුයයි සිතන්නන්ගේ
මිථ්‍යාග්‍රාහාදිය වලක්වනපිණිස සමන්තපාසාදිකානම් අටුවා
හි මෙසේ දක්වනලදී—"අන්තොගාමෙවාහොතු විහාරෙවා
මනුස්සානං පරිවෙසනට්ඨානං ගච්ඡන්තෙන චීවරං පාරුපි
ත්වා කායබන්ධනං බන්ධෙව වට්ටන්ති අට්ඨකථාසු වුත්තත්තා"—
න්තාවය—ඇතුළුගම හෝ වේවා විහාරයෙහි හෝ වේවා මිනි
සුන් පිස කා දන්දෙනතැනට සිවුරපොරවා යන්නහු විසින්
කායබන්ධනය බඳිනලද්දේම වටියයි අටුවාහි කියනලදී-
මෙසින් විහාරොපචාරය තුළ නමුත් මිනිසුන් නවාතැන්ගෙ
ණ පිස කා වසනතැනට යන්නහු විසින් කායබන්ධනය බැ
ඳගෙණම යායුතුබව දක්වනලද්දේය—එසේවීනමුත් ඇතම්
පින්වතුන් චීවරං පාරුපිත්වා යනු මෙකිපාඨයෙහි පූර්වභාග
යෙහි ලියනලද හෙයින් පළමුකොට සිවුර පොරවා ඊපිට
පටිය බැදගෙණ යායුතුයයි කියනබැව් දනිමු—පෙරවූ සිවුර
මත්තෙහි පටියක් බැන්දයුතුනම්—පෙරවූසිවුර වැටිමක් නි
දානකොට පටියක් ඊපිට බඳිනලෙස පැණවූ ප්‍රඥප්තියක් ති
බියයුතුයි—හඳනය හැඳිමපටන් සිවුරුදරණ පිළිවෙළ වදාළ
තැනින්ද—නිදානය සහ ප්‍රඥප්තියෙන්ද. එය බැඳියයුතුතැ
න විශෙෂයෙන් හැඟේ—සූත්‍රාදි යම් කිසිතැනක වචනයෙ
දුන පිළිවෙළින් ව්‍යඤ්ජනච්ඡායාවෙන් නොගතයුතුයි—එ
සේ ගතයුතුනම් මේ චීවරපාරුපණ විෂයෙහිමත් වෙනතැ
න්ද ව්‍යාකුලවේ—එනම්—දෙසනාපාළියෙහි—සඞ්ඝාටියො පා
රුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වායි—සඟලසිවුරු පොරවා ගණ්ඨි
යඅමුනනබව කියාතිබියදී අටුවාහි—"ගණ්ඨිකංපටි මුඤ්චිත්වා,
අනුවාතනෙතන ගීවං පටිච්ඡාදෙත්වා උභොකණ්ණෙ සමංක
ත්වා"—යනාදීන් ගණ්ඨිය අමුනා නුවාකෙලවරින් ග්‍රීවයවසා
දෙකොණ සමකොට—යනාදීන් ගණ්ඨිය ඇමිනිම පූර්වකො
ට දක්වනලදී—මෙවචනයෙදීම නානාප්‍රකාරවූ නමුත්. පිළි
වෙළ දෙසනාවේ අ නයින්ම පොරවා පසුව ගණ්ඨිය ඇමි
නිමමයි. එසේම—අටුවාවේ-නාමපද ක්‍රියාපද කොයිකොයි
තන්හි තිබුනත්—දෙසනාවේ අ පිළිවෙළින් අඳනය හැද ඊ
මත්තේ පටියබැඳ සිවුරුපෙරවිය යුතුයි—ඊට සිහිඇති කව
රෙකුට නමුත් සැකයක් නැත්තේයි—සඩහායනාවලට නැඟු
ණු දෙසනාදියෙහි දක්වාතිබෙන පිළිවෙළ එසේමය—එසේ
නොකොට පෙරවූ සඟලසිවුර මත්තෙහි කායබන්ධනය බැඳී

මක්. බුඩසාසනික භික්ෂූන්ට නැත්තේය, එසේබැවින්ද හො
ත් දෙමළ අස්නොවූවන්ගේ තනුත්‍රාණ පාරුපණයට සමාන
වේ—ඇතම් ආවාසපරම්පරාවල විහාරයෙහි භික්ෂූන් වනාව-
ත්කරණ කල්හි පොරවණලද උත්තරාසඞ්ගය මත්තෙහි ප
රික්ඛාරචොළ නමින් ඉටා පරිභොගකරණු ලබන පටකින්
බැඳීම ව්‍යවහාරයට පැමිනතිබේ. එය කායබන්ධනයක් කො
ට නොසිනියයුතුයි. ඊට සූකරන්තක නම්වූ කායබන්ධනයක්
ගන්නා නොලැබේ.

## කා ය බ න්ධ න ක ථා.

---

## 7

තවද. සඞ්ඝාටියට ගණ්ඨිකය පාසකයයි. අවයව දෙකක්
දක්වයුතුයි—එයපැණවීමට නිදානය කවරේදයත්—චූලව
ග්ගයෙහි මෙසේ පෙණේ.

> "තෙනඛොපන සමයෙන ආයස්මා ආනන්දො ලහුකාස
> සඞ්ඝාටියො පාරුපිත්වා ගාමං පිණ්ඩායපාවිසි. වාතමණ්ඩ
> ලිකාය සඞ්ඝාටියො උක්ඛිපීයිංසු. අථඛො ආයස්මා ආ
> නන්දො ආරාමංගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.
> භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං අනුජානාමි
> භික්ඛවෙ ගණ්ඨිකපාසකන්ති."

භාවය—ඒකල්හි වනාහි ආනන්දස්ථවිරයන්වහන්සේ සැහැ
ල්ලුවූ සඟලසිවුරු පොරොවාගෙණ ගමටපිඩුපිණිස ප්‍රවිෂ්ට
වූසේක-සුළන්මඬුල්ලකින් සඟළසිවුරු ඔසවාලනලද්දාහුය.
ඉක්බිති ආනන්දස්ථවිරයන්වහන්සේ ආරාමයටපැමිණ භික්ෂූන්
ට මේ අර්ථයදැන්වූහ. භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට සැල
කළාහුය. මහණෙනි ගණ්ඨිකයක් පාසකයක් අනුදනිමියි
අනුදැන වදාළසේක. රන්රිදීආදියෙන් කරණලද ගණ්ඨිකය
වලක්වා අස්ථිදන්තාදියෙන් හෝ නූලින්ම හෝ කරණලද
ගණ්ඨිකය-අනුදැන වදාරණලදෙද්ය—එම ගණ්ඨියද පාසයද.
සිවුරේමතබා බැඳීමවලක්වාද."අනුජානාමි භික්ඛවෙ ගණ්ඨි
කඵලකං පාස ඵලකං"යි—මහණෙනි ගණ්ඨිකඵලකයක්ද.
පාසකඵලකයක්ද අනුදනිමියිද ඒ ගණ්ඨිකපාසකයන් තබාබැ
ඳිමට පෝරුකඩදෙකක් හෙවත් සිවුරුකැබලි දෙකක්ද අනු

දැනවදාළසේක. එසේ පෝරුකඩවල තබාබඳිනලද ගණ්ඨිකයද පාසකයද සිවුරේකොණේම තබාබැඳීම වලක්වා බැඳියයුතු තැන්දනියමකොට වදාළසේක ඒ මෙසේයි ''අනුජානාමි භික්ඛවෙ ගණ්ඨිකඵලකං අනෙනඅපෙපතුං පාසකඵලකං සත්තඞ්ගුලංවා අට්ඨඞ්ගුලංවා ඔගාහෙත්වා අප්පෙතුන්ති,, මහණෙනි ගණ්ඨියේ පෝරුව සිවුරේඅන්තයෙහි තබාබඳිනටද. පාසකයේ පෝරුව සතඟුලක් හෝ අටඟුලක් හෝ ඇතුළුකො තබාබඳිනටද අනුදනිමියි වදාළසේක-මෙසේ සිවුරේඅන්තයෙහිද සත් අටඟුලක්පමණ ඇතුළුකොට සිවුර තුළද බඳින්නට නියමකර වදාරණලද ගණ්ඨිකය පාසකයෙහි ඇමුණුකල සැහැල්ලු සඟළසිරුනමුත් සුළඟින්එසවීනොයෙත්-එසේ ගණ්ඨිය පාසයෙහි නාමුනාමිනායේ නියමකළ ලෙස සගලසිවුරුපොරවා ගියහොත් වාතයෙන් එසවියනු හැකිවේ.

තවද මෑතකාලයෙහි සිවුර ඒකාංශකොට කායවිවෘතකොට ගම්වදිනා භික්ෂූන්ගේ ඒ සිරිත නොසැලකිමෙන් අනදරිත්වූ එකක්බවට සාක්ෂිනම් ඒ භික්ෂූහු සිවුරේ ගණ්ඨිපාසදනොබඳිති එහෙයින් ගණ්ඨිය පාසයෙහි අමුනා පෙරවීමක්ද නැත්තේය-කඨිනයක් අතුරණකල්හි කඨිනචීවරයට පූජිකෘත්‍යයක් වශයෙන් ගණ්ඨිපාසබැඳීම කටයුතු හෙයින් ඒ කඨිනචීවරයෙහි පමණක් ගණ්ඨිකපාසකයන් බඳිති නුමුත් කිසිතැනකදී නාමුනති-මේපාරුපණයගැණ සාකච්ඡාදිය පවත්නත්තාසින් පසු ඇතම්අය ඒකාංශකොට පොරවණලද සිවුරේ ගණ්ඨිය පාසකයෙහි අමුනත්යසි ඇසූමු එය මේ වාදයේ අධර්මපක්ෂය ස්ථිර කරණුපිණිස මේ අලුරුදුනුණ අතරේ පටන්ගත් එකකි, කිසිම ආචාර්‍යපරම්පරාවක පැවතනායේය-ඒකාංශකොට පෙරවීමට ගණ්ඨිය ඇමිණියයුතුබවක් සඞ්ගීතිනුණට නගණලද ත්‍රිපිටකයට ඇතුළත් දෙසනාපාලි අඨකථා ටීකාදිවූ කිසිපොතකින් දකිනුනොලැබේ—එහෙයින් ඒ ක්‍රියාවද බුද්ධශාසනයට ප්‍රතිපක්ෂවේ

## ගණ්ඨිකපාසක කථා.

---

## 8

තවද. සුපටිච්ඡන්නකොට පොරොවණලද සගලසිවුර හිඳිනා කල්හි පැවැත්වියයුතු සැටි මෙසේ දතයුතු—ඛන්ධකයෙහි

''තෙනඛොපන සමයෙන භික්ඛූ සඞ්ඝාටිපල්ලත්ථිකාය නිසීදන්ති සඞ්ඝාටියො පත්තා ලුජ්ජන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං න භික්ඛවෙ සඞ්ඝාටිපල්ලත්ථිකාය නිසීදිතබ්බං යො නිසීදෙය්‍ය ආපත්ති දුක්කටස්සාති''—මෙහි භාවය—එසමයෙහි වනාහි භික්ෂූහු සඟළසිවුරු වතුරුවා ගැණීමෙන් යුක්තව නොහොත් සඟළසිවුරු යටකොට හිඳිත් සඞ්ඝාටියේ සිවුරුපත් නසිත් භාග්‍යවතුන්වහන්සේට මේ අර්ථය සැලකළාහුය. මහණෙනි සඟළසිවුර වතුරුවා හොවත් යටකොට ගැණීමෙන් යුක්තව හිඳිය යුතුනොවේ-යමෙක් එසේ හිඳී නම් ඔහට දුකුළා ඇවැත් වෙයි වදාළසේක—සඞ්ඝාටිනාමයෙන් ඉටාගත් සිවුරවතුරුවා හෙවත් යටකරගෙණ හිඳීම තහනම් කරණ ලදෙද්ය-විනයවිනිශ්චයෙහි.

''න නිසීදෙය්‍ය සඞ්ඝාටිපල්ලත්ථිකමුපාගතො
''කම්බලං නකිලෙය්‍ය පලිතං නච ගාහයෙ.

මෙහිභාවය—සඟළසිවුර වතුරුවාගැණීමෙන් හෙවත් යටකොට ගැණීමෙන් යුක්තව නොහිඳින්නේය—කිසියම් ක්‍රීඩාවක්ද නොකරන්නේය. පැසීගිය හිසකෙස් ආදියද නුගුළුවන්නේය—මීට ටීකාවෙහි මෙසේ කියනලද්දේය—''සඞ්ඝාටිපල්ලත්ථිකමුපාගතොති එත්ථ සඞ්ඝාටිනාමෙන අධිට්ඨිතචීවරමාහ සඞ්ඝාටිපල්ලත්ථිකං උපාගතෙන යුතෙනා භුත්වාති අත්ථො, න නිසීදෙය්‍යාති විහාරෙවා අන්තරඝරෙවා යත්ථ කත්ථචි න නිසීදෙය්‍ය''—භාවය-සඞ්ඝාටිපල්ලත්ථිකමුපාගතො යනමෙනි සඞ්ඝාටිනාමයෙන් ඉටාගත් සිවුර කියා, සඟළසිවුර යටකර ගැණීමට පැමිණීමෙන් යුක්තවය යන අර්ථයි—න නිසීදෙය්‍ය යන්නෙන් අර්ථයනම් විහාරයෙහි හෝ ඇතුළුගම හෝ යම් කිසිතැනක නොහිඳින්නේය—එසේ සඟළසිවුර යටකොට ගෙණ හිඳියයුතුනොවේනම් සඟළසිවුර ඔසවාගෙණ හිඳිය යුතුද යත්-''න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා—න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛාකරණීයා''යි—සෙඛියාවේ ප්‍රථමවර්ගයේ නවවෙනි දසවෙනි ශික්ෂාපද දෙකින් ඔසවනලද සිවුරු ඇතිව ඇතුළුගම යාමද හිඳීමද තහනම් කරණලද්දේය—අටුවාහි—''නිසින්නකාලෙ ධම්මකරකං නීහරන්තෙනාපි අනුක්ඛිපිත්වාව නීහරිතබ්බො''—මෙහි භාවය—හුන්කල්හි ධබරාව බැහැරකරන්නහු වසින්ද (සිවුර) නොසවාම බැහැර කටයුතුයි—සිවුර එසවීමේ ප්‍රමාණය ටීකාහි මෙසේ කියනලදී—''උක්ඛිත්තචීවරො හුත්වාති කටිතො උද්ධං කායබන්ධනාදිදස්සනවසෙන උක්ඛි

පත්තං සන්ධාය වුත්තං පිණ්ඩාය චරතො පත්තගහණාදි මත්තස්ස අනුඤ්ඤාතත්තා—මෙහි භාවය—ඔසවනලද සිවුරු ඇතිව යනු උකුලෙන්උඩ කායබන්ධනාදිය * පෙණීම වසයෙන් උසවීම සඳහා කියනලදී—පිඩුපිණිස හැසිරෙන්නාහුගේ පාත්‍රය ගැණීම් ආදී ප්‍රමාණය අනුදන්නාලද බැවිනි--මෙහින් විවරගබ්භයේ තිබෙන පාත්‍රාදිය පිටගන්නා පමණට සිවුර එසවීමද අනුදත්බව කියනලදී—තවද ටීකාහි මෙසේ කියනලදී—"නිසින්නකාලෙහි ධමෙකරකපත්තත්ථවිකාදිතො ධම්මකරකං නීහරන්තස්ස කප්පතො උඩම්පි දිස්සති තථා අදස්සෙත්වා නීහරිතබ්බන්ති අධිප්පායො—ආසනෙ නිසීදන්තස්සාපි පාරුපණවිවරං උක්ඛිපිත්වා සඞ්ඝාටිං ජඞ්ඝපිණ්ඩෙහි අනක්කමිත්වා නිසීදිතබ්බන්තො—මෙහි භාවය—ආසනයේඋත්කාන්හි උරහිසේ එල්වනලද පාත්‍රයේ පසුම්බිය යනාදියෙන් ධබරාව බැහැරකරන්නාහුගේ කට්යෙන්උඩද පෙණෙහි—එසේ නොදක්වා බැහැරකටයුතුය යන අර්ථයි—ආසනයෙහි හිඳිනාහුගේද පොරෝනාසිවුර ඔසවා සඞ්ඝාටිය කෙණ්ඩා පිඩුමසින් නොමැඩම හිඳියයුතුබැවිනි—මෙසේ ගෙයින් සඟළසිවුර පොරෝගෙණ ගොස් ආසනයක ඉන්නාකල සඟළසිවුර ඔසවා කෙණ්ඩයෙන් නොමැඩෙන පමණට තාබාගෙණ අඳනයෙන් ආසනයේ හිඳිනසේ හිඳිය යුතුයි—මෙකල ලඞ්කාවේ කොයිසමාගම්වලත් භික්ෂූන් සඟළසිවුරු පොරවා අසුන්හි හිඳිනාකල මෙකීලෙස සඟළසිවුර එසවීමක් නොකරණනුමුත් මතෙහි එය එසේම කරණසේ කරුණා මෛත්‍රියෙන් යුක්තව සලකත්වා—කිසියම් බ්‍යජනච්ඡායා වස්යෙණ විවාද නොකෙරෙත්වා—මේ සඟළසිවුර එසවීම ගැණ ටීකාහි කියනලද කාරණයත් සම්බන්ධව පෙණෙන පාපසුම්බියෙහි තිබෙන ධබරාව පිටට ගන්නාපිණිස සඟළ සිවුර කට්යෙනුත්උඩ එසවෙනබැව් යනාදිය සිතාවත් ගත් යමෙක් ඒකාංශකොට පොරවා ඒසිවුර පටියකින් වෙළා තිබියදී ඒ වෙළා බඳනාලද සිවුරතුළ තිබෙන පාසුම්බියෙන් ධබරාව ගන්නට ඒ වෙළා බැඳි සිවුර එසව්යයුතුව තිබෙයි-එසේ විශ්වාස කොට කියානම් ඒ අද්භූතයි ආශ්චර්ය්‍යයි.

## සඞ්ඝාටිපල්ලත්ථිකා පටිසෙධනකථා.

---

* කායබන්ධනය බැඳ තිබෙනතැන මෙයින් හැඟේ.

# 9

# උදාහරණ.

බුඩදෙශනාවේ සම්කරුණක් සම්පරිද්දෙකින් දැනගණ ඇත්තේද, ඊට උදාහරණවස්තූහුද විද්‍යමානවෙති, උදාහරණවස්තූනැත්නම්, එය දැනගත්ක්‍රමය විරුඩවූසේ සිතියයුතුයි- මේ අපවසින් විනයපිටකයෙන් ප්‍රකාශකළ පිළිවෙළින් ඇතුළුගම් වදනාකල්හි සුපටිච්ඡන්නාව පාත්‍රය ගෙණගොස් සිටි භික්ෂුනමක් පාත්‍රය දකුණතින් බැහැරකළකල්හි මැණික්කට්ටුවෙන් පාත දැනත් බිම්බලා නමනලද ගලවළිත්මතු භිසත් කෙණ්ඩයේ පිඩුමසින් පාත දෙපයත් පෙණෙන්ටතිබේ- එසේම කථාවස්තූන්ගෙන් ප්‍රකාශවේ—ආයුෂ්මත් සුදින්නයන් වත්සම්පන්නාව සුපටිච්ඡන්නාව තමන් පියානන් ගෙදෙරට පැමිණසිට ඒගෙයි කෙල්ලවිසින් ගෙණ කොමුපිඩු පිළිගන්නට පාත්‍රය එලවනකල්හි ඇට මැණික්කට්ටුදෙකින්පාත අත්දෙකත්-අඳනයේ අන්තයෙන් පාත පාදෙකත් පෙණුනේය-විනයේ භික්ෂුවිභඞ්ගයෙහි මෙසේ පෙණේ—"අථඛො ආයස්මතො සුදින්නස්ස ඤාතිදාසී තං ආභිදොසිකං කුම්මාසං ආයස්මතො සුදින්නස්ස පත්තෙ ආකිරන්තී හත්ථානඤ්ච පාදානඤ්ච සරස්සච නිමිත්තං අග්ගහෙසි"—භාවය-ඉක්බිත්තෙන් ආයුෂ්මත් සුදින්නයන්ගේ ඤාතිදාසිතොමෝ ඒ පිලුනු (හෙවත් පසුගිය සවසපිසූ) කොමු ආයුෂ්මත් සුදින්නයන්ගේ පාත්‍රයෙහි හෙලන්නී හස්තයන්ගේද පාදයන්ගේද ස්වරයාගේද ආකාර හැඳිනගත්තිය—ඊට සමන්තපාසාදිකා අටුවාවෙහි—කුරුන්දි මහාපච්චරිආදියෙහි ආනයින් මෙසේ දක්වනලදී—"හත්ථානන්ති භික්ඛාගහණත්ථං පත්තං උපනාමයතො විතතමපි හත්ථානං පාදානන්ති නිවාසනන්තතො පට්ඨාය විතතමපි පාදානං"—මෙහි භාවය-හස්තයන්ගේය යනු භික්ෂාව පිළිගන්නාපිණිස පාත්‍රය එලවන්නාහුගේ මැණික්කට්ටුපටන් අත්දෙකේමද, පාදයන්ගේය යනු අඳනයේ අන්තයේපටන් පාදදෙකේද"—(ආකාරයි)—ගිහිගෙදරට සුපටිච්ඡන්නාව පාත්‍රය ගෙණගොස් සිටිනකල්හි පාත්‍රයගත් දකුණුඅත විවරගර්භයතුළම තිබෙනහෙයින් භික්ෂාව පිළිගන්නාපිණිස පාත්‍රය නියමපමණට බැහැරකරණ කල්හි ඒඅතේ මැණික්කට්ටුවෙන් පාත පෙණෙනබවත් වම්අතේ මැණික්කට්ටුව වැසෙනසේම පොරවාතිබෙන හෙයින් ඒ අතෙත් මැණික්කට්

වූවෙන් පාත පෙණෙනබවත් භගවා අටුවාවෙහි සරාකල ගුවන්මැද පත් හිරුමඬල පෙන්වන්නාසේ කියනලද්දේය— මජ්ඣමනිකායෙහි-"අථඛො ආයස්මතො රට්ඨපාලස්ස—පෙ— නිමිත්තං අග්ගහෙසි"-ඉක්බිත්තෙන් ආයුෂ්මත් රට්ඨපාලයන් ඤාතිදාසීතොමෝ ඒ පිළිතූ කොමු ආයුෂ්මත් රට්ඨපාලයන්ගේ ජංනුයෙහි බහන්නී හස්තයන්ගේද පාදයන්ගේද ස්වරයාගේද (ගිහිකලදන්නාවූ) ආකාර සැලකීය—ප්‍රපඤ්චසූදනී නම් මජ්ඣමනිකායාර්ථ කථාවෙහිද-"හත්ථානනානි මණිබන්ධතොපපඤාහි වීනාමපි හත්ථානං"—හස්තයන්ගේය යනු මැණික්කට්ටුපටන් අත්දෙකේය යනාදීන් සමන්තපාසාදිකාවේ ආනයින් ප්‍රකාශකරණලදී—එත්සම්පන්නව බිමබලා වැඩසිටින භික්ෂූන් මූනුන බලා ඇඳිනීම දුෂ්කරහෙයින්ද,—"නැගනීය" යනාදීන් කථාකළහඬින් තමන් අයිපනියාගේ ශබ්දයයි හැඟුනූහෙයින් මූනුන බලනු නොහැකිහෙයින්ද, සිවුරෙන් වැසීතිබෙන කය හැර අත්දෙකේ මැණික්කට්ටුවෙන් පාතද පාදෙකේ අඳනයේ අන්තයෙන් පාතද කෙල්ලන් දක්කබව විශෙෂයෙන් භගවා දක්වනලද්දේය—සමන්තපාසාදිකාවෙහිද විනයවිනිශ්චයෙහිද උභයාංශතුටයන් විවෘතනොකරන්නට නියමකළලෙසද, ටීකාහි එකාංශකොට පෙරවූකල කායව්වෘත වනබව කීහෙයින්ද, කායවිවෘත කොට ඇතුළුගමට පැමිනීම තහනම්කොට තිබෙනහෙයින්ද, ග්‍රීවයහා උපාඹිකායද, පිඩුමස් අවසන්කොට අබඃකායද වසා සුපටිච්ඡන්නකරන්ට නියමකළපරිද්දෙන් ඒ ආයුෂ්මතුන් පොරවා ඇතුළුගමට පැමිණිවිට දකින්නට පූළුවන්පමණ මෙකී උදාහරණදෙකින් යහපත්සේ සියල්ලන්ටම වැටගේමය *—තවද, බුඩාදි චෛත්‍ය වන්දනාකරණකල්හිද දිසීමාගීගයක යනකල්හිද ආරාමයෙහි වසනකල්හිද එකාංශකොට පෙරවියයුතු

---

* පෙලෙහි, පිඩුපිණිසවැඩසිටි සුදින්නයන්ගේ ඤාතිදාසිය, සුදින්නයන්ගේ, හස්තපාදාදියේ ලකුණු හැඳිනගත්තියයි කියාතිබෙනවිට—හස්තයන්ගේ මෙපමණක් දක්කායයි අටුවාවෙහි කුමටකියනලද්දේද, සුපටිච්ඡන්නකොට පොරවා වැඩසිටි උන්වහන්සේගේ හස්තපාදයන් ඈ කෙමලස දක්කාදැයි යමෙකුට සැකයක් වියහැකිසි—ඉත්නිසා පාත්‍රය එලියටගන්නාවිට මැණික්කට්ටුවලින්පාත අත්දෙකත් අඳනයේ අන්තයෙන් පාත පාදෙකත් පෙණෙන්නට පුළුවන්බැවින් එපමණ දක්කබව අර්ථකථාචාර්යයන්විසින් කියනලදී.

බවද, ඇතුළුගමට පැමිණෙනකල්හි සුපටිච්ඡන්නව පැමිණිය යුතුබවද ප්‍රකාශමය.

බුද්ධාදිචෛත්‍යයන් වඳනාකල්හි ඒකාංශකොට පොරවනාබවට උදාහරණ--මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි—අථඛො ආයස්මා මහාකස්සපො යෙන කුසිනාරා මකුටබන්ධනං මල්ලානං චෙතියං, යෙන භගවතො චිතකො, තෙනුපසංකමි උපසංකමිත්වා එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා පාදතො විවරිත්වා භගවතො පාදෙ සිරසා වන්දි- තානිපි ඛො පඤ්චභික්ඛුසතානි එකංසං චීවරං කත්වා අඤ්ජලිං පණාමෙත්වා තික්ඛත්තුං චිතකං පදක්ඛිණං කත්වා භගවතො පාදෙ සිරසා වන්දිංසු—ගාථාය—ඉක්බිත්තෙන් වනාහි ආයුෂ්මත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ කුසිනාරානුවර මල්ලරජුන්ගේ මකුටබන්ධනනාම් චෛත්‍ය සඞ්ඛ්‍යාත මඞ්ගලශාලාව යම්තැනෙක්හිද භාග්‍යයතුන්වහන්සේගේ සෑය යම්තැනෙක්හිද, එතනට එලඹිසේක, එලඹ සිවුර ඒකාංශකොට ඇඳිලිනමාගෙණ තුන්වරක් සෑය ප්‍රදක්ෂිණකොට පාදභාගයෙන් විවෘතකොට භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මස්තකයෙන් වැන්දසේක—ඒ පන්සියයක් භික්ෂූන්වහන්සේලාද සිවුරු ඒකාංශකොට ඇඳිලිනමාගෙණ හෙවත් දෑහොත්මුදුන්දී තුන්වරක් සෑය ප්‍රදක්ෂිණකොට භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් හිසින් වැන්දෑහුය—මහාකාශ්‍යපස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපාපිහිපිනැත් සලකා අභිඥාපාදකචතුර්ථධ්‍යානයට සමවැදීම් ආදිවශයෙන් විස්තරය අටුවාහි කියනලද්දේය—මෙයින් චෛත්‍ය වන්දනාකරණකල්හි පොරවණලද සිවුර ඒකාංශකොට ගෙණ වඳනාබැව් පැහැදී වැටහේමය—බ්‍රහ්මජාලසූත්‍රනිදානයෙහි පෙණෙනපරිද්දෙන් රජගහනුවරින් නාලන්දාවට පත්වන දික්මාර්ගයට පැමිණි මහරහතුන් වහන්සේලා සිවුරු ඒකාංශකරගෙණ වැඩියසැටි අටුවාහි—"තස්මිං පන දිවසෙ යෙභුය්‍යෙන අසීතිමහාථෙරා මෙඝවණ්ණං පංසුකූලං එකංසං කත්වා කනකරදණ්ඩා ආදාය"—එදවස වනාහි බොහෝසේම අසූමහතෙරුන්වහන්සේලා මෙඝවර්ණවූ පාංශුකූල සිවුරු ඒකාංශකොට සැරයටිගෙණ—යනාදීන් දක්වන ලද්දේය—ඇතුළුගම් වදනාකල්හි එසේ ඒ සිවුරු ඒකාංශකරගැණීමක් කිසිතැනකින් නොපෙණේ—නුවරකටහෝ ගමට වඩනාවූ භික්ෂූන්වහන්සේලා නුවරදෑර ගම්දෑර දක්වා

ඒකාංශකොට පොරවාවැඩ නුවරදොර ගම්දොරදී කායබ
න්ධනය බැඳ සුපටිච්ඡන්නකොට පොරවති—මිහින්තලේ වැ
ඩසිටි මහාමහින්දාදී මහරහතුන්වහන්සේලා අනුරාධපුරයේ
දෙවනපෑතිස් මහරජානන්ගේ රාජමන්දිරයට වඩනාපිණි
ස—මිහින්තලෙන්වැඩ ථූපාරාමනම්වූ ප්‍රථමකචෛත්‍යස්ථා
නයෙහි වැඩසිට කායබන්ධනයන්බැඳ සිවුරු සුපටිච්ඡන්න
කොට පෙරවූහ—එය සමන්තපාසාදිකාවෙහි මෙසේ කියන
ලද්දේය—'වෙහාසං අබ්භුග්ගන්ත්වා අනුරාධපුරස්ස පුරත්ථිම
දිසායං පඨමකචෙතියට්ඨානෙ ඔතරිංසු''—නාවය (මහින්දාදී
මහරහතුන්වහන්සේලා) අහසට නැගී අනුරාධපුරයේ නැ
ගෙණහිර දිග්භාගයෙහි ප්‍රථමකචෛත්‍යස්ථානයෙහි බැස්සා
හුය-යනාදියයි—'සො සාරථි නගරවාරං සම්පත්තො තතො
අද්දස ථෙරෙ පඨමතරං ආගන්ත්වා කායබන්ධනං බන්ධිත්වා චී
වරං පාරුපන්තෙ''--ඒ රථාචාර්‍යයීතෙම නුවරදොරට පැමිණි
යේ ඉස්බින්තෙන් පළමුකොට අවුත් කායබන්ධනයන් බැඳ
සිවුරු පොරවන්නාවූ තෙරුන්වහන්සේලා දුටුයේය—මෙය
ආරඤ්ඤකවතෙහිද පිණ්ඩචාරික වතෙහිද දෙශනාකරතිබෙ
න ක්‍රමයට යහපත්ලෙසම යෙදේමය—ඒ මෙසේය—''ඉදා
නි ගාමං පවිසිස්සාමීති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිම
ණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා
සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං
ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො''—
දැන් ගමටවදනෙම්යි (සිතා) තෙමඬුළු වසන්නාහු හාත්පසින්
මඬුළුඇතිකොට ඇඳ කායබන්ධනය බැඳ සඟසාටින් සගුණ
කොට පොරවා ගණ්ඨිය අමුනා පාත්‍රය සෝදාගෙණ මනා
කොට හනුනොවන්නාහු විසින් ගම්වැදියයුතුයි—යනමේ දෙ
ශනාවට ඉතායහපත්ලෙස නුවරදොරදී කායබන්ධනය බැඳ
සිවුරුපෙරවූබව ඒකාන්තවේ—විහාරයේදී පොරවණලද පෙ
රවීමෙන්ම ඇතුළුගමට යායුතුයයි කියන්නන්ගේ කීමට මෙ
ය කිසිසේත් නොගැළපේ—පිඬුපිණිස වඩනා සර්වඥයන් ව
හන්සේහෝ රහතුන් වහන්සේලාහෝ විහාරයෙන් නික්ම
යම්කිසි පරිබ්‍රාජකාදීන්ගේ ආශ්‍රමයකට වඩිනුකැමතිනම් ඒ
කාංශකොට පොරවාගෙණ ඒ ආශ්‍රමයට වැඩමවා නැවත ග
ම්වදනාකල්හි සුපටිච්ඡන්නකොට පොරවා වඩිනසේක-එය,
පොට්ඨපාදනම් සූත්‍රයේනිදානය යනාදියෙන් ප්‍රකාශවේ—
බුද්ධත්වයට පැමිණෙනපිණිස බෝමුල වැඩඋන් සිද්ධාර්ථයන්
වහන්සේද දක්ෂිණහස්තය පොළවට දිගුකොට වදාළේ

චීවරාභ්‍යන්තරයෙන් බැහැරකොටයි-“චීවරබ්භන්තරතො දක්ඛිණහත්ථං අභිනීහරිත්වා” යි ජාතක අටුවාහි කියනලද්දේයි.—දෙශනාඨ කථාදියෙහි මේආදී උදාහරණයෝ බොහෝ පෙණෙති.

# උ දා හ ර ණ නි ර්දෙ ශ ක ථා.

# 10

---

තවද ඒකාංශකොට පෙරව්මම සුප්‍රතිච්ඡන්නයයිකියන පින්වත්හු සුප්‍රතිච්ඡන්න කොට පෙරවීම උභයාංශයද උභයබාහුවද උභය කච්ඡයද උභයසනනද වැසෙනහෙයින් උභය බාහු යනාදිය නොකියාම උභයාංසය වැසීමපමණක් ගෙණ බුදුන් දැකදැකද සඟමැදද උභයාංශය පෙරවීම අගෞරවපිණිස අනාදරපිණිස වෙයි කියා එයින් සුප්‍රතිච්ඡන්න පාරුපණය නැතිකරන්නට කථාකෙරෙත්—ඒ මහත් අභූතයකි-අගෞරවයට ප්‍රධානකොට නියමකරතිබෙන්නේ අචිත්තීකාරයකි හෙවත් සිතින් ගරුනොකිරීමයි—එය මේදෙශනාවෙන් දතයුතුයි—“බුද්ධෙ අගාරවො විහරති අප්පතිස්සො” බුදුන්කෙරෙහි ගෞරව රහිතවූයේ නිච්චෘත්තිරහිතවූයේ වාසයකෙරෙයි—යනාදීන්වදාළ බුද්ධවචනයන්ගේ අභිප්‍රායදක්වන අට්ඨකථාවන්හි විස්තරවශයෙන් මෙසේ ප්‍රකාශකරණලද්දේය—“යො භික්ඛු සත්ථරි ධරමානෙ තීසු කාලෙසු උපට්ඨානං නයාති, සත්ථරි අනුපාහනෙ චඞ්කමන්තෙ ස උපාහනො චඞ්කමති, නීචෙ චඞ්කමෙ චඞ්කමන්තෙ උච්චෙ චඞ්කමෙ චඞ්කමති, හෙට්ඨාවසන්තෙ උපරිවසති, සත්ථුදස්සනට්ඨානෙ උභො අංසෙ පාරුපති, ඡත්තං ධාරෙති, උපාහණං ධාරෙති, උච්චාරං වා පස්සාවං වා කරොති”—එවමාදි-මෙනිභාවය—යම් මහණෙක්තෙම ශාස්තෲන්වහන්සේ ජීවමානකාලයෙහි තුන්කල්හි උපස්ථානයට නොයේද ශාස්තෲන්වහන්සේ වහන්නැතිව සක්මන්කරණ කල්හි වහන් සහිතව සක්මන්කෙරේද මිටිවූ සක්මන්මළුවක සක්මන්කරණකල්හි උස්වූ සක්මන්මළුවක සක්මන්කෙරේද යටමාලයක වසනකල්හි උඩුමාලයක වෙසේද සර්වඥයන්වහන්සේ දක්නා තැන උභයාංසය පොරවාද කුඩ දරාද වහන් දරාද ස්නානය කෙරේද වර්චස්හෝ මූත්‍රකෙරේද—යනාදිය සර්වඥ

යන්වහන්සේට අගෞරවයි—සර්‍වඥයන්වහන්සේ පිරිනිවීක
ල්හි බුද්ධචෛත්‍යස්ථානයන්හි ඒ ක්‍රියාකෙරේනම් අගෞර
වයි—ඒබැව් මහාකාශ්‍යපාදී ශ්‍රාවකයන් වහන්සේලා විසින්
බුද්ධචෛත්‍යයෙවූ සදුන්දරසැයලගට පැමිණි පැවනි පරිද්දෙ
න්ද ප්‍රකාශවේ—එනම්, කුසිනාරානුවර බුද්ධශරීරය ආදාහණ
කරණ දරසැයලගට වැඩවදාළ මහාකාශ්‍යපාදී මහරහත් ස්ථ
විරයන් වහන්සේලා පොරවාහිබුනු සිවුරු ඒකාංශ කොට සර්‍ව
ඥයන්වහන්සේට පරම ගෞරවයෙන් නිචවෘතනියෙන්ගෞ
රවකොට දෙහොත්මුදුන්බැඳ නමස්කාරකර වදාළාහුමය—
සඞ්ඝයාකෙරෙනි අගෞරව ප්‍රකාශකිරීමෙගි—"යො ථෙරෙ
න භික්ඛුනා අනජ්ඣිට්ඨො ධම්මං දෙසෙති නිසීදති පඤ්හං
කථෙති බුඩ්ඪෙ භික්ඛූ සඞ්ඝට්ටෙන්තො ගච්ඡති තිට්ඨති නිසී
දති දුස්සපල්ලත්ථිකං වා හත්ථපල්ලත්ථිකං වා කරෙති සඞ්ඝම
ජ්ඣෙ උභොඅංසෙ පාරුපති ඡත්තුපාහණං ධාරෙති භික්ඛු
සඞ්ඝස්ස ලජ්ජිතුං වට්ටතිති වුත්තෙ තුණ්හී හොහි සඞ්ඝො ස
ඞ්ඝොති ථිරවස් කිං සඞ්ඝො මිගසඞ්ඝො අජසඞ්ඝොති ආදීනි
වදති අයං සඞ්ඝෙ අගාරවො නාම—භාවය—යමෙක් වනායි
ස්ථවිර භික්ෂූන්විසින් ආරාධනා නොකරණලද්දේ ධම්මදෙස
නා කෙරේද අස්නේ හිඳීද ප්‍රශ්නකථනය කෙරේද වැඩිම
හල්වූ භික්ෂූන්ගටමින් යේද සිටීද හිඳීද වස්ත්‍රපල්ලත්ථිකාව
කොට හෙවත් වස්ත්‍රවතුරුවා ඉඳිමහෝ හස්තපල්ලත්ථිකාව
කොට හෙවත් අත්වතුරුවා ඉඳිමහෝ කෙරේද සඟමැද්දී
දෙඅංශය පොරවාද කුඩවහන්දරාද භික්ෂුසඞ්ඝයාට ලජ්ජා
වෙන්ට වටියයි කීකල්හි නිශ්ශබ්දවෙව සඞ්ඝතෙමේය ස
ඞ්ඝතෙමේයයි විශේෂරූපයක් කරන්නෙගිය, කිමෙක සමූ
හතෙම මුවසමූහයාද එළුසමූහයාදැයි යනාදීන්කියාද, මේ
සඞ්ඝයාකෙරෙහි අගෞරවය නම්වේ—මෙහි ථෙරෙන භික්ඛු
නා අනජ්ඣිට්ඨො යනාදීන් චිත්තීකාරරහිතව හෙවත් ආද
රගෞරව නැතිවත් මෙකී ක්‍රියාකරණ තන්හිම අගෞරව
වෙනබව දක්වනලද්දේය, එහෙයින්ම වර්තමානක්‍රියා යොද
නලදී—එහෙයින් යමෙක් වැඩිමහල් භික්ෂුනමක්හුගේ ඇගේ
හැපිහැපී යානම් සිටිනම් හිඳිනම් අගෞරවවේ—ඒ අගෞර
වය සඞ්ඝයාකෙරෙහි කළ අගෞරවයක්වේ—එසේම සඞ්ඝ
කම්මයක්පිණිස සඞ්ඝයා රැස්ව හිඳිනතන්හි යමෙක්සිට සි
වුර දෙඅංශයෙහි දමානම් අචිත්තීකාරයෙන් කරණහෙයි
න් අගෞරව වේ—ඝූපප්වජීතනාකොට පෙරවීම ඇතුළුගමට
යනවත සම්පාදනය කරණුපිණිසම කරති—එහි චිත්තීකා

රයම මිස අචිත්තීකාරයක් කිසිසේත් නොවේ—එහෙයින්ම දූන් ඇතුළුගමට යම්සිස්තා විහාරෙපචාරයෙන් නික්ම ගම වඇතුල්වන කල්හිද එය කටයුතුවේ—ගමට ගොස් විහාර යට එනකල්හි උපචාරයට පැමිණෑද චෛත්‍යස්ථානයන්ගේ උපචාරයට පැමිණද ඒකාංශකරගැණීම පරම ගෞරවයපිණි ස කරණුලැබේ-මහවග දෙශනාපාලියෙහි-“නාභිකඛෙව ආ චරියෙසු ආචරියමත්තෙසු උපජ්ඣායෙසු උපජ්ඣායමත්තෙසු අනුපාහනෙසු මඬකමමානෙසු සඋපානෙන චඞකමිතබබං,

යො චඞකමෙය්‍ය ආප ත්තිදුකකටස්ස”—භාවය—මහණෙනි ආචාය්‍ය්‍යයන් ආචාය්‍යයන්ටසම්ප්‍රමාණවූවන් උපාධ්‍යායයන් උපා යයන්ට සමප්‍රමාණවූවන් වහන්නැතිව සක්මන්කරණ කල් හි, වහන්සහිතව නොහොත් වහන් පයලාගෙණ සක්මන් නොකටයුතුයි—යමෙක් එසේ සක්මන් කරන්නේනම් ඔහුට දුකුලා ඇවැත්වේ—මෙයින් ආචාය්‍යාදි වැඩිසිටියන් වහන්පය නොලා සක්මන්කරද්දී ඒලඟ බාලනමක් වහන් පයලාගෙ ණ සක්මන්කරතොත් එය අගෞරවබව හගවනලදී--වැඩි සිටියන් වහන් පයලා සක්මන්කරණකල්හි තමනුත් වහන් පයලා සක්මන්කළායින් අගෞරවයක් නොවේ--ඇතුළුගම් වදනා භික්ෂූන් කාවිසිනුත් සුපරිච්ඡන්නකොට යායුතුවේ-එසේනොකොට යමෙක් ගියොත් ඒ ඔහුගේ වරදකි එසේ යනවිට දූන් ඇතුළුගමට යම්සී මෙනෙහිකොට අඳනය තෙ මඬුළුවසා හැඳ කායබන්ධනය බැඳ සිවුරු සුපරිච්ඡන්නකොට පොරවා ගණ්ඨිය අමුණාගත්කල්හි නැවත සගමැදකට වත් චෛත්‍යයක් ලඟටවත් පැමිණ උභයාංශයේ සිවුරුදැමීමක් එහි නැත්තේය-ගමින් නැවති විහාරයට එනකල්හි උපචාර යටපැමිණ සිවුරු ඒකාංශ කොට විහාරයට පැමිණියයුතුයි-එකල්හි පරමගෞරවය වේමය.

## ගාරවාගාරවපරිදීපන කථා.

---

## 11

තවද බුද්ධාගම මනාලෙස පවත්නා සියම් බුරුම රක්ඛඞග කාම්බොජ ලාවා සුංක්‍රා මිපිලා යනාදිදෙශවල විනයකර්මාදිය මනාකොට පවත්වන ධම්මවිනයධරාචාය්‍ය්‍යයන්ගෙන් යුක්ත සියළුම සද්විරපරම්පරාවල භික්ෂූන් ඇතුළුගම්වදනා සැමකල් හිම මෙහි දක්වනලද විනයක්‍රමයෙන් ග්‍රීවයසහ උභයාංශ උභයබාහු උභයකඩච්ඡාදිය වැසෙනසේ පොරවා ගණ්ඨිඅමුනා සුපරිච්ඡන්න කරණ සිරිත පවත්නේය--එසේම ලඞකාවිපයෙ හි සියම්සමාගමේද පැවතායේය--උඩරට සමහර පරම්පරා

වල මේතාක්ම එසේ පැවතෙන්නේය--ශ්‍රීබුද්ධවර්‍ෂයෙන් 2427
ත්දී පාරුපණය ගැණ පත්‍රයක්ද ප්‍රසිද්ධකළ අප අටනම අතු
රෙහි වැඩිදෙනෙකුන්ට බාලකාලයෙහි ආචාර්‍ය්‍යව වැඩසිටි
යේ වලානේ සිද්ධාර්‍ථාභිධාන ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ
ය--අපට පිඩුපිණිස යාමට ඒ ස්වාමිපාදාදී ආචාර්‍ය්‍යයන් ව
හන්සේලා විසින් පුරුදුකරණ ලද්දේත් එසේම උභයාංශ
උභයබාහු උභයකට්ජාදිය වසා ගණ්ඨිඅමුනා සුප්පටිච්ඡන්න
කිරීමයි--පිණ්ඩචාරිකාවෙන් තොරව ඇතුළුගම යම්තැනක
ට එසේ නොපොරවා යාම ප්‍රමාදයෙන් වීනමුත් එය ඉගැන්
වීමක්නොවී--ආචාර්‍ය්‍ය පරම්පරාවේ යම්යම්සේ පැවතආවත් එ
සිත් ප්‍රඥප්තියට අවිරුද්ධදෙයක්ම කැපවන්නේය-මූලවංශයෙ
හි මෙසේපෙණේ-''ආචිණ්ණකප්පො අවුසො එකච්චො කප්ප
ති එකච්චො නකප්පති''—භාවය-ඇවැත්නි උපාධ්‍යායාචාර්‍ය්‍ය
යන්විසින් පුරුදුකරණලද ආචිණ්ණකල්පය ඇතැම්එකක් කැප
වන්නේය—ඇතැම්එකක් කැප නොවන්නේයයි සබ්බකාමි ම
හාස්ථවිර ස්වාමින්වහන්සේවිසින් වදාරණලද්දේය-එහෙයින්
ආචාර්‍ය්‍ය පරම්පරාවේ පැවතආවාවූ සූත්‍රසූත්‍රානුලෝමාදියට සම
වන්නක්ම කැපවන්නේය—අපේ ආචාර්‍ය්‍යයන් ඇතුළුගම පි
ඩුපිණිස යාමට උගන්වනලද පාරුපණය කොයියම් පිටක
ද ඇතුළුගමට යාමට යොග්‍යබව මෙහි යටකියනලද දෙශ
නා පාඨාදියෙන් වැටහේමය—මේ බුද්ධශාසනයෙහි සිවුරක
ට පත්පොටය යන අවයවයක් දෙශනාවෙහි නොපෙණේ—
එසේම සඟලසිවුරපොරවා ගණ්ඨියඅමුනා ඊමත්‍ර බැඳියයුතුවූ
කායබන්ධනයක්ද නොපෙණේ—අදනය නොවැටෙනපිණි
ස බැඳියයුතු කායබන්ධනයක් අනුදන්නාලද්දේය—එසේම
පත්පොටක්නබා සඟලසිවුරමත්තේ පටියක්බැඳ ඇතුළුගම්
වදනා ආචාර්‍ය්‍යපරම්පරාවක සිරිතක් පිටරටකහෝ මෙරටේ
හෝ භික්ෂූන්අතරේ අපට බුද්ධවර්‍ෂ 2426 පසුගනතෙක්ම දකි
න්ට හෝ අසන්ටහෝ නොලැබුනේය—එසේ දෙශනාපාඨාදී
යේ නොපෙණෙන ආචාර්‍ය්‍යපරම්පරාවකත් නැතිකුමයක්පිළි
ගැණීම අයොග්‍යහෙයින් නොගණුම්හ.

තවද, ඛුද්දසික්ඛායෙහි.

''සඞ්ඝාටිපච්ඡිමනෙතන දිඝසො මුට්ඨිපඤ්චකා
උත්තමනෙතන සුගත චීවරූනාපිවට්ටති
මුට්ඨිත්තිකඤ්ච තිරියං තථාඑකංසිකස්සපි.''

භාවය—සඟලසිවුර අන්තිමපරිච්ඡේදයෙන් දිගින් මිටිපස්
රියණක් ඇතිවේ—සරස මිටිතුන්රියණයි—උත්තමපරිච්ඡේද
යෙන් සුගත්සිවුරෙන් අඩුවූවක්දවටී—එකාංසික සිවුරට හෙව
ත් ඒකාංශකොට පෙරවියයුතු සිවුරටද ප්‍රමාණ එසේමය—
ප්‍රකෘතියෙන් ඒකාංශකොට පෙරවියයුතු තනිපට සිවුර සඟ

ළසිවුර නොවේ-සඟළසිවුර ප්‍රකෘතියෙන් ඒකාංශකරන්නටයුතු විවරයක් නොවේ—ඒ සුපරිච්ඡන්නකොට පෙරවීමට නියම සිවුරයි—පොරොවණය සඟළසිවුර සුපරිච්ඡන්නකොට පෙරවීමෙහි එකට ගළපනුලබනකල්හි සුපරිච්ඡන්න කිරීමට ගැළපේ—සඟළසිවුර පොරවාසිට ගෞරවාදියෙන් යුක්තව වතක් පවත්වනපිණිස ඒකාංශකිරීමෙහි එසේ කරණුලැබේ.

එහෙයින් සඟළසිවුර ප්‍රකෘතියෙන් සුපරිච්ඡන්නකොට පෙරවීමෙහි පරිභොගකරණුලැබේ.

## ප කි ණ්ණ ක ක ථා.

සමන්තායං සුද්ධච්ඡාද විභාවිනී.

සම්මාසම්බුද්ධපඤ්ඤත්ත පඤ්ඤත්තිඤ්චත්ථතොබුධා
අචරියනයෙචාපි විභජන්තු යථාක්කමං.

අනාදියන්තනො ගාහං බ්‍යඤ්ජනත්ථඤ්ච කෙවලං
සුභං විනිච්ඡයං සුට්ඨු නිවාසනකථායපි.

තථා පාරුපණෙ චාපි කරොන්තෙව විසුං විසුං
තතො චෙකංසකරණෙ සුපරිච්ඡන්නතායපි.

නෙකතොපරිකප්පෙන්තු නානාපඤ්ඤත්තියොජන
පඤ්ඤත්තිවිසයං සම්මා විජානන්තා සුපෙසලා.

මුනිසෙට්ඨපඤ්ඤත්තං තතොනුබුද්ධෙහි විභත්තමත්ථතො
අදොසසන්තොව ඤත්වා සම්මාරක්ඛන්තු සාධවො.


සබ්බෙභජන්තු කුසලං සුඛිතාභවන්තු
කාලෙ පවස්සතු ඝනො ජනවුද්ධිහෙතු.

ඉච්ඡාචනො භවතු සම්ඵලිතා සමිද්ධා
ධම්මංචරන්තු සතතං පථවිස්සරාපි.

සිද්ධි.

1 කලණිවිහාරාධිපති දෙම්පේ බුද්ධරක්ඛිත.
2 තලාහේණේ අමරමොලි.
3 රත්මලාණේ සුමනතිස්ස.
4 කොටුවේගොඩ ඤාණානන්ද.
5 හෙයියන්තුඩුවේ දේවමිත්ත.
6 කොස්කඳවල සුනන්ද.
7 පොල්වත්තේ සොමානන්ද.
8 වලානේ ධම්මානන්ද.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු